# "යහ පාලනයට" – 'උග්‍ර ප්‍රශ්න' නොවේද ?

**නිහාල් ශ්‍රී අමරසේකර විසින්, ඔහුගේ දිවුරුම් ප්‍රකාශය සමග, පි.බී. ජයසුන්දරගේ පෙත්සමට අභියෝග කරමින්, 2009.7.27 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉදිරිපත් කල විරෝධතා ප්‍රකාශය අමුණා ඇත. පි.බී. ජයසුන්දර එම විරෝධතා ප්‍රකාශයේ අඩංගු කරුණු ප්‍රතික්ෂේප නොකර, එමගින් එම කරුණු නිවැරදි බවට පිළිගෙන ඇත.**

එහි (විශේෂයෙන් පිටු **22** සිට **51** හි, **14** ඡේදයේ උප ඡේදයන් හි) අඩංග්‍ර කරුණු අනුව, පි.බී. ජයසුන්දර නැවත අප රටේ මහජන මුදල් භාර ප්‍රධාන නිලධාරි හැටියට පත් කිරීම –

i) **නීත්‍යානුකූලද ?** – පොදු දේපළ පනතේ විධි විධාන යටතේ මහජන දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම, ඇප නැති, අවුරුදු **20** කට සිරගත කළ හැකි බරපතල වරදකි.

ii) **ව්‍යාවස්ථානුකූලද ?** – ව්‍යාවස්ථාවේ **28** (ඇ) වගන්තිය අනුව පොදු දේපළ ආරක්ෂා නොකරමින්, අයථා පරිදි පරිහරණය කිරීම, වෘත්තියක නියුක්ත වීම ඇතුළුව, ව්‍යාවස්ථාවේ ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට අයිතියක් නැත.

iii) **සදාචාරාත්මකද ?** – රජයේ සාමාන්‍ය සේවකයකු සුළු වරදකට හුදෙක් සැක කළ පමණින්ම, පරීක්ෂණයක් පවත්වන අතරතුර,[1] වැඩ තහනම් කොට සේවා ස්ථානයෙන් බැහැර නොකරන්නේද ?

iv) **නීතියේ ආධිපත්‍යයට හානියක් නොවන්නේද ?** – ලංකා මරයින් සහ රක්ෂණ සංස්ථාව පුද්ගලිකකරණය අවලංගු කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවල අඩංගු කරුණු අනුව, අල්ලස් හා දූෂණ කොමිසමද, අපරාධ විමර්ශණ දේපාර්තමේන්තුවද විමර්ශණ කරද්දී, එම විමර්ශණවලට බලපෑමක් නොවන්නේද ?

v) **භාරකාරකමේ වගකීමට අගරු නොවන්නේද ?** – මිහිඳු මහා රහතන් වහන්සේගේ දේශනයට අනුව, අප රටේ ඓතිහාසික බෞද්ධ නිගමනයක් වන, භාරකාරත්වයේ වගකීම, කෙලසීමක් නොවන්නේද ?

**ලංකා මරයින් සහ රක්ෂණ සංස්ථාව පුද්ගලිකකරණ නීති විරෝධී, අනෛතික සහ වංචනික පදනම මත ශ්‍රේෂ්ඨාධිකරණය අවලංගු කළ තීන්දු වලින්, තවද එළිදරව් වන්නේ, එම දූෂිත ගනු දෙනු දෙක භාරව ක්‍රියා කළ ඇමති මිලින්ද මොරගොඩගේ ක්‍රියාවන්ද, සාපරාධී විමර්ෂණ වලට යටත්වන බවය. එම විමර්ෂණ මෙහෙයවන නීතිපතිතුමා යටත්වන, අධිකරණ ඇමති ලෙස, එම නඩු තීන්දුවලින් පසුව, මිලින්ද මොරගොඩ පත් කිරීම නීතියේ ආධිපත්‍යට පයින් ගැසීමක් නොවන්නේද ? දූෂණය සහ වංචාවට අත පොවන්නක් නොවන්නේද ?**

*සිංහල පරිවර්තනයකි*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය

රාජ්‍ය තනතුරු දැරීමට අදාළව 8 වන වගඋත්තරකරු විසින් ගොනු කළ 2008 ඔක්තෝබර් 16 වන දින දරණ දිවුරුම් ප්‍රකාශය මගින් වුන පොරොන්දු බැඳීම පිළිබඳව සහනයන් සඳහා වන ඉල්ලීමක් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙනි.

වාසුදේව නානායක්කාර
නීතිඥ, අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශක,
ලේකම්, ප්‍රජාතාන්ත්‍රික වාමාංශික පෙරමුණ,
49 1/1, විජයලංකාර මාවත,
කොළඹ 10.

**පෙත්සම්කරු**

**ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම්**
**ඉල්ලීම අංකය: 209/2007**

**එදිරිව**

1. කේ.එන්.චොක්සි,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කලින් මුදල් අමාත්‍ය,
23/3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

2. කරු ජයසූරිය,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කලින් විදුලිබල සහ බලශක්ති අමාත්‍ය,
2, අමරසේකර මාවත,
කොළඹ 05.

3. රනිල් වික්‍රමසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කලින් අග්‍රමාත්‍ය,
115, 5 වන පටුමග,
කොළඹ 03.

4. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ශ්‍රී ලංකාවේ කලින් ජනාධිපතිනිය,
හොරගොල්ල වලව්ව,
හොරගොල්ල.

5. මිලින්ද මොරගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කලින් ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය,
3/2, ඇලන් මැතිනියාරාම පාර,
කොළඹ 05.

6. ශ්‍රීපති සූරියආරච්චි,
නීතිඥ, පාර්ලිමේන්තු මන්ත්‍රී,
කලින් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය,
22, නිවාස මාවත, රිලාඋල,
කඳාන.

7. චරිත රත්වත්ත
කලින් මහාභාණ්ඩාගාරයේ ලේකම්,
16, ජාවත්ත පාර,
කොළඹ 05.

8. පී.බී.ජයසුන්දර
මහාභාණ්ඩාගාරයේ ලේකම්/කලින්
සභාපති,
රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ
කොමිෂන් සභාව (PERC)
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 01.

9. පී.වීරහැන්දි
කලින් ලේකම්,
විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය,
410/7, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

10. දහම් විමලසේන
කලින් සභාපති,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
සාමාජික, කාර්මික අගැයුම් කමිටුව,
22/11, සුභද්‍රා මාවත,
මාදිවෙල.

11. උපාලි දහනායක
කලින් අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය,
සාමාජික, කාර්මික අගැයුම් කමිටුව,
32, පීරිස් ඇවනියු, ඉඩම,
මොරටුව.

12. ඒ.ඩබ්ලිව්.සී.පෙරේරා
කලින් අතිරේක ලේකම්,
ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
සාමාජික, කාර්මික අගැයුම් කමිටුව,
57/2, රජමහා විහාර පාර,
පිටකෝට්ටේ.

13. ශාමලී ගුණවර්ධන,
නීතිඥ, කලින් අධ්‍යක්ෂ, නීති,
PERC,
500/111, තිඹිරිගස්යාය පාර,
කොළඹ 05.

14. DFCC බැංකුව
73/5, ගාලු පාර,
කොළඹ 03.

15. ඉඩම් කොමසාරිස්
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
7, ග්‍රෙගරිස් ඇවනියු,
කොළඹ 07.

16. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
19, චර්ච් වීදිය,
කොළඹ 01.

17. ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව,
109, රොටුන්ඩා ටවර්,
ගාලු පාර,
කොළඹ 03.

18. සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස්
130, ග්ලෙනී වීදිය,
කොළඹ 02.

19. සී/ස ලංකා මරයින් සර්විසස්
69, වෝල්ස් පටුමග,
කොළඹ 15.

20. සුසන්ත රත්නායක,
සභාපති,
සී/ස ජෝන් කීල්ස් හොල්ඩිංස්,
130, ග්ලෙනී වීදිය,
කොළඹ 02.

21. වී. ලින්තොටවල,
කලින් සභාපති,
සී/ස ජෝන් කීල්ස් හොල්ඩිංස්,
55, අබ්දුල් කෆූර් මාවත,
කොළඹ 03.

22. නිහාල් ශ්‍රී අමරසේකර
කලින් සභාපති,
රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ
කොමිෂන් සභාව,
167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

23. ඩබ්ලිව්. එම්. බන්දුසේන
කලින් සභාපති,
රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන්
සභාව,
XB 1/2/2, එඩ්මන්ටන් නිවාස,
කිරුළපන,
කොළඹ 05.

24. ඩබ්ලිව්.ජ්.එස්.පෙරේරා
සභාපති,
රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ
කොමිෂන් සභාව,
බටහිර කුළුණ, 11 වන මහල,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

25. චන්න ද සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය පාලන
කොමිෂන් සභාව, (SEC)
11-01 මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01.

26. ලලිත් වීරතුංග
අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

27. විජයදාස රාජපක්ෂ
පාර්ලිමේන්තු මන්ත්‍රී,
සභාපති, රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ
පාර්ලිමේන්තු කාරක සභාව (COPE)
17, වීජේබා මාවත, නාවල පාර
ඔස්සේ,
නුගේගොඩ.

28. පොලිස්පති
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

29. නියෝජ්‍ය පොලිස්පති
අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව,
4 වන මහල, නව මහලේකම්
ගොඩනැගිල්ල,
කොළඹ 01.

30. සභාපති
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

31. ගරු නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

**වගඋත්තරකරුවන්**

32. සී/ස ශ්‍රී ලංකා ෂිපිං සමාගම
රොබට් සේනානායක ගොඩනැගිල්ල,
46/5, නවම් මාවත,
තැ.පෙ.1125,
කොළඹ 02.

33. සී/ස ලංකා මැරිටයිම් සර්විසස්
3 වන මහල, රොබට් සේනානායක
ගොඩනැගිල්ල,
46/5, නවම් මාවත,
කොළඹ 02.

34. සී/ස ලංකා සර්විසස් (පුද්ගලික)
සමාගම
1 වන මහල, රොබට් සේනානායක
ගොඩනැගිල්ල,
46/5, නවම් මාවත,
කොළඹ 02.

**එකතුකළ වගඋත්තරකරුවන්**

**සහ දැන්**

පී.බී.ජයසුන්දර
අංක.761/සී, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**8 වන වගඋත්තරකාර-පෙත්සම්කරු**

එදිරිව

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

**31 වන වගඋත්තරකාර-වගඋත්තරකරු**

**අතරය**

***ගරු අග විනිසුරු උතුමාණන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජ ශ්‍රේෂ්ඨාධිකරණයේ අතිකුත් ගරු විනිසුරු උතුමාණන් සහ උත්තමාවියන් වෙතය***

වර්ෂ 2009 ක්වූ ජූලි මස 27 වන දිනදී ය.

(මෙහි මින්මතු සමහර තැන් හි **"8 වන වගඋත්තරකරු"** යනුවෙන් සඳහන් කරනු ලබන) කලින් 8 වන වගඋත්තරකරුගේ 2009.07.07 දින දරණ (මෙහි මින්මතු **"පෙත්සම"** යනුවෙන් සඳහන් කරනු ලබන) පෙත්සමට සහ ඔහුගේ 2009.07.07 දිනම දරණ අනුරූපි දිවුරුම් ප්‍රකාශයට එරෙහිව, තමාම පුද්ගලිකව පෙනී සිටිනු ලබන ඉහත නම සඳහන් 22 වන වගඋත්තරකරුගේ විරෝධතා ප්‍රකාශයේ මෙසේ ප්‍රකාශ කර සිටී :

**මූලික විරෝධතාවයන්**

1. මූලික විරෝධතාවයන් වශයෙන් 22 වන වගඋත්තරකරු ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කර සිටින්නේ,

(a) i) එම ඉල්ලීම කර ඇත්තේ කුමන ව්‍යවස්ථානුකූල හෝ ව්‍යවස්ථාපිත විධි විධානයන් යටතේ ද යන්න පිළිබඳව කිසිදු සඳහනක් පවා ශීර්ෂයෙහි දක්වා නොමැතිවාසේම, එම ඉල්ලීම නීතියෙහි ලා වැරදි අදහසින් යුතුව කරන ලද්දක් සහ සලකා බැලිය යුතු ගුණාංගයකින් තොරවන්නක් සහ මෙම ආකාරයට ඔබ උතුමාණන්ගේ අධිකරණයේ පිහිට පතා සිටීමට නොහැකි වන පමණින්ම, කලින් 8 වන වගඋත්තරකරුගේ ඉල්ලීම මුල් ආරම්භයේදීම ප්‍රතික්ෂේප කළ යුතුය,

ii) එකතු කළ වගඋත්තරකරුවන් ඇතුළුව සියළුම වගඋත්තරකරුවන්ගේ නම් අඩංගු දෙවැනි ශීර්ෂයක් රහිතව සහ 8 වෙනි වගඋත්තරකරු වෙනුවට එම තනතුර දරණ වත්මන් තැනැත්තා ආදේශ නොකරමින්, කලින් 8 වන වගඋත්තරකරු එම ඉල්ලීමෙහි ඔහුව විස්තර කර ඇත්තේ "8 වන වගඋත්තරකාර-පෙත්සම්කරු" වශයෙනි,

iii) *තවද කලින් 8 වන වගඋත්තරකරුගේ දිවුරුම් ප්‍රකාශය දිවුරුම් ප්‍රකාශවලට බලපවත්නා නීතියට අනුකූල නොවන්නේය,*

(b) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාවෙහි නියමිතව ඇති පරිදි ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන්නා වූ *පොදු වැදගත් කමකින් යුක්ත* වන්නා වූ ප්‍රශ්නයක් තිබෙන බවට, මොනයම් හෝ සාක්ෂියක් ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය අභියස තබා නැති අතර, විධායක හා පරිපාලනමය ක්‍රියාවන් පිළිබඳව දැක්වෙන වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ කරන ලද උද්දේශිත ඉල්ලීමක් මගින් කලින් 8 වන වගඋත්තරකරු එවැනි සහනයක් පතා නැති අතර, එසේ එහෙයින් කලින් 8 වන වගඋත්තරකරුගේ ඉල්ලීම නීතියට ප්‍රකට වන්නා වූ ප්‍රාරම්භයක් මත නොවන්නේය,

(c) *වෙනත් දේ අතර,* එහි ව්‍යවස්ථාවන් හි අණවලට අනුගාමීවීමට සහ ඒවා ඉටු කිරීමට ශ්‍රී ලංකාව බැඳීමකට යටත් කරමින්, රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශයක් එහි විෂය රාමුවට ඇතුලත් වන්නා වූ, දූෂණයට එරෙහිව වන එක්සත් ජාතීන්ගේ 2005 ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වී එය ස්ථිර කරන ලද අතර, එසේ අනුගාමීවීම සහ ඉටුකරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (15) ව්‍යවස්ථාවේ නියම කර ඇත.

(d) i) මෙම නඩුව අසන අතරතුර රජයේ නීතිඥවරයා විසින් පෙරකලාසිය ඉදිරිපත් කරන ලදුව, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා කලින් 8 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටියේ ය.

ii) කෙසේ වුවද 2008.07.21 දින තීන්දුව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, රජයේ නීතිඥවරයා විසින් පෙරකලාසිය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබීමෙන්, නව නීතිඥවරයකු මාර්ගයෙන් කලින් 8 වන වගඋත්තරකරු පෙනී සිටියේ ය.

iii) එම අවස්ථාවේ දී කලින් 8 වන වගඋත්තරකරු දැන් **අවුරුද්දක තරමේ වූ කාලයකට පසු**, කියා පෑමට උත්සහ දරා ඇති මෙහි පහත 8 වන ජේදයේ උපුටා දක්වා ඇති ප්‍රකාර, පහත සඳහන් අයුරින් කියා සිටියේ නැත.

> **"රාජ්‍ය සේවයේ මාගේ (කලින් 8 වන වගඋත්තරකරුගේ) මුළු සේවා කාලය පුරාම, මම සත්‍යවාදිකම සහ අවංකභාවය උපරිම මට්ටමින් පවත්වාගෙන ගියෙමි**
>
> **........................**
>
> **රාජකාරී කටයුතු උපරිම කැපවීමකින් සහ අවංක සිතින් යුතුව රටෙහි විශිෂ්ටතම යහපත වෙනුවෙන් ඉටුකල අතර, ජනතා උත්තතිය කවරවිටකවත් මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත ........"**

iv) මෙහි මතු, වඩාත් විශේෂයෙන් 14 (a) සිට 14 (o) දක්වා වන ජේදයන් හි වැඩි මනත් ලෙස දක්වා සිටිනු ලබන හේතුන් මත, 22 වන වගඋත්තරකරු උක්ත කාරණයන් පිළි ගන්නේ නැති අතර, ඒවා සම්පූර්නයෙන් ම වැරදි ලෙසට සහ සත්‍යයෙන් සහ යථාර්ථයෙන් බොහෝ ලෙසින්ම දුරස්ථ වන ලෙසට ප්‍රතික්ෂේප කර සිටී.

v) ඇත්ත වශයෙන්ම, ඉහත දැක්වෙන්නේ, මෙහි පහත 8 වන ඡේදයේ වඩාත් පූර්ණ ලෙස දක්වා ඇති පරිදි, එවකට ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට දැන දැනම සහ <u>චුවමනාවෙන් ම</u> වසන් කර ඇත්තා වූ, එනම් වසරකට ආසන්න කාලයකට පෙර, <u>2008.07.25</u> දින දරණ කලින් 8 වන වගඋත්තරකරුගේ ලිපියෙන් උපැටුමකි.

vi) 8 වන වගඋත්තරකරුගේ ක්‍රියාවන් සාවද්‍ය, නීති විරෝධී සහ අනෛතික වන බවට ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් තිගමනය කරමින්, රාජ්‍ය සේවාව අතහරින ලෙසට ඔහුට නියම කරන ලද අවස්ථාවේදී, ඔහු විසින් ඉල්ලා අස්වීම බාර දෙන ලදුව, <u>ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ නියමයන්ට ගරු කරමින්,</u> කිසිදු අනුමානයකින් තොරව, අතිගරු ජනාධිපතිතුමා විසින් ඉල්ලා අස්වීම පිළිගෙන ඇත.

vii) 8 වන වගඋත්තරකරුගේ එම <u>2008.07.25 ("A")</u> ලිපියට <u>පිළිතුරු වන</u>, ඔහුගේ පෙත්සමට "B" සහ "C" ලෙස ලකුණු කර ඇති <u>2008.07.31</u> සහ <u>2008.09.17</u> දින දරණ ලිපි මගින් සාක්ෂි දරණ ප්‍රකාර, අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ 26 වන වගඋත්තරකාර ජනාධිපතිතුමාගේ ලේකම්වරයා විසින් හෝ, 8 වන වගඋත්තරකරුගේ පෙත්සමට "A" ලෙස ලකුණු කර ඇති ඔහුගේ <u>2008.07.25</u> දින දරණ ලිපියෙහි 8 වන වගඋත්තරකරු විසින් කර ඇති ඉහත සඳහන් ප්‍රකාශය කෙරෙහි <u>ඒ අවස්ථාවේ එකඟතාවයක් දක්වා නැත</u>.

viii) 2008.07.21 දින දරණ නඩු තීන්දුවේ, ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ඔහුට එරෙහිව කරන ලද බරපතල සහ දැඩි තිගමනයන්ට සහ උග්‍ර දෝෂාරෝපණයන්ට පසුවත් රාජ්‍ය තනතුරු දැරීම ගැන, ඔහුගේ පෙත්සමට "D" ලෙස ලකුණු කර ඇති 2008.10.16 දින දරණ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරමින් ආනුෂංගිකව 8 වන වගඋත්තරකරු කණගාටුව ප්‍රකාශ කරමින්, ගරු ඔබඋතුමාණන්ලාගේ අධිකරණයෙන් නොපසුබට සමාවක් අයැද සිටින ලද අතර, මෙය ඔහු විසින් වගකීම බාර ගැනීමකට සහ සිදුකළ වරද පිළිගැනීමකට සමවන්නේය. ඒ අනුව, වෙනත් ආකාරයකට ප්‍රකාශයක් කර සිටීමෙන් ඔහු දැන් පරිබාධනය වී ඇත.

ix) ඔහුගේ පෙත්සමට "F" ලෙස ලකුණු කර ඇති <u>2009.06.03</u> දින දරණ ලිපියේ 3 වන ඡේදයෙහි පහත සඳහන් වගන්තියෙන් සාක්ෂි දරණ පරිදි, ඇත්ත වශයෙන් ම, ඔහුට විරුද්ධව අහිතකර තිගමනයන් ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කර ඇති බව 8 වන වගඋත්තරකරු පිළිගෙන ඇත.

> **"මෙම සම්බන්ධතාවයෙන් අදාල වැදගත් කරුණු අධිකරණය විසින් අවධානයට ගතහොත්, මට විරුද්ධව අහිතකර තිගමනයන් විය නොහැකි බව, එම නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව මාගේ නීතිඥවරු විසින් මට උපදෙස් දෙන ලදී"**

කෙසේ වෙතත්, සියළුම අදාළ වැදගත් කරුණු ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අවධානයට ගෙන නොමැති බව සහ එම වැදගත් කරුණ මොනවාද යන්නත්, එම නියමිත අවස්ථාවේ දී ඔහු පෙන්වා දී සිටියේ නැත.

x) මෙහි මතු ජේදයන් හි, වඩාත් විශේෂිතව 14 ජේදයෙහි අඩංගු කාරණා මගින් බිඳහෙලනු ලබන, රාජ්‍ය අංශයේ ඔහුගේ සේවයේ වැදගත්කම හෝ ඔහු දැන් වසරකට පමණ පසුව උද්දේශිතව ප්‍රකාශ කර සිටින රාජ්‍ය සේවයෙහි ඔහුගේ කල්ක්‍රියා ලීලය පිළිබඳව ඒ අවස්ථාවේ දී 8 වන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ නැත.

(e) i) මෙම ඉල්ලීමේ ප්‍රධාන පෙත්සමේ 2(aa) ජේදයේ පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කර ඇත.

> **"31 වන වගඋත්තරකරු, සී/ස ලංකා මෙරයින් සර්විසස් (19 වන වගඋත්තරකරු) වෙත ප්‍රදානය කර ඇත්තාවූ, පසුව අභියාචනාධිකරණය විසින් අභියෝගයට ලක්කල සාවද්‍ය සහ නීතිවිරෝධී ඒකාධිකාරිය පිළිබඳව දැනටමත් මත ප්‍රකාශයක් කර ඇති, ශ්‍රී ලංකාවේ ගරු නීතිපති තුමා වන්නේය."**

ii) ප්‍රධාන පෙත්සමේ 20(c) ජේදයෙහි ප්‍රකාශ කර ඇති පරිදි, බත්තල් මගින් බන්කර් ඉන්ධන ප්‍රවාහනය කිරීමට අතිකුත් බන්කර් අයිතිකරුවන්ට ඉඩහැරීම යම් ප්‍රතික්ෂේප කිරීමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන බව, වෙනත් දේ අතර, ප්‍රකාශ කරමින්, ප්‍රධාන ඉල්ලීමේ පෙත්සමට "P21" ලෙස ලකුණු කර ඇති 2004.03.03 දින දරණ මත ප්‍රකාශය ගරු නීතිපතිතුමා විසින් දෙන ලදි.

iii) පූර්වෝක්ත මත ප්‍රකාශය නියත ලෙසින්ම ප්‍රධාන පෙත්සමේ 16 වන ජේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, 8 වන වගඋත්තරකරු විසින් "P19(a)" ගිවිසුමට හොර රහසේ ඇතුළත් කරන ලද "ඒකාධිකාරී" වගන්තිය හා සම්බන්ධයෙනි.

iv) ගිවිසුමේ මෙම වගන්තිය නීතිවිරෝධී සහ පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතිය ඉක්මවා යන්නක් ලෙසට, *වෙනත් දේ අතර*, නිගමනය කරමින් ප්‍රධාන පෙත්සමට ("P22") ලෙස ලකුණු කර ඇති අංක.CA(Writ) 829/2005 දරණ ඉල්ලීමේ තීන්දුව මගින්, අභියාචනා අධිකරණය විසින් නොතිසි නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර සිටින ලදි.

v) 2008.07.21 දින ප්‍රකාශයට පත් කරන ලද තඩු තීන්දුවේ 61 පිටුවේ 15 ජේදයේ අවසානයේ, ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් මෙසේ නිගමනය කරන ලදි.

> **"ජයසුන්දර (එනම් 8 වන වගඋත්තරකරු) විසින් එකඟවූන වගන්තිය අනෛතික වන්නක් ලෙසට අභියාචනාධිකරණය විසින් කපා හැර ඇත."**

vi) ඉහත කී හේතු තත්වයන් අනුව, 22 වන වගඋත්තරකරු ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කර සිටින්නේ, 8 වන වගඋත්තරකරු විසින් ඇතුලත් කරන්නට යෙදුන අභියෝගයට ලක් වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන බවට ගරු නීතිපතිතුමා විසින් මත ප්‍රකාශයක් කර ඇති බැවිනුත්, එම වගන්තිය අභියාචනාධිකරණය සහ ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අනෛතික වන ලෙසට කපා හැර ඇති බැවිනුත්, 8 වන වගඋත්තරකරු විසින් කර ඇති වත්මන් ඉල්ලීම තහවුරු කරමින් පෙනී සිටීමෙන් ගරු නීතිපතිතුමා පරිබාධනය වී ඇති බවය.

(f) මෙහි පහත සඳහන් 14.0) iii) ඡේදය 22, වන වගඋත්තරකරු නැවතත් ප්‍රකාශ කර සිටී.

> "SC (FR) අංක.158/2007 දරණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා නඩුවේ එළිදරව්වීම් අභිමුඛයේ ප්‍රශ්නාත්මක ලෙස 8 වන වගඋත්තරකරු විසින් වසා දැමීම සිදුකළ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අනුයුක්තවීමට, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සිට ඉන් ඉල්ලා අස්වූ, හාර්වර්ඩ් සරසවියෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිලාභී සහ එක්සත් රාජධානියේ කළමණාකාර ගණකාධිකරුවන්ගේ සම්මානනීය සාමාජිකයකු වන ඒ.අරුමුගම් නැවත රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට නැවතත් අනුයුක්තවීම සහ අතිරේක අධ්‍යක්ෂකවරයෙකු ලෙස ඔහු රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවට නැවත අනුයුක්ත වීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය නොතකමින් ද 8 වන වගඋත්තරකරු, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ලෙස, <u>ඊට හාත්පසින්ම ප්‍රති විරෝධී වෙනස් ආයුරින්</u> වලක්වා සිටින ලදි. **<u>එම මූලධර්මයට 8 වන වගඋත්තරකරුට ද බලාත්මක විය යුතුය.</u>**"

***ඒ හා සමානවම,* වත්මන් ඉල්ලීම කිරීමෙන් 8 වන වගඋත්තරකරු <u>පරිබාධනය</u> වීමේ තත්වයට පත්ව ඇත.**

(g) (i) *දැන් වසරක පමණ ආසන්න කාලයකට පසු,* මෙම ඉල්ලීම කිරීමට අඩිතාලමක් සකසා ගනු පිණිස, ඔහුගේ පෙත්සමට **"F"** ලෙස ලකුණු කර ඇති, 2009.06.30 දරණ ඔහුගේ ලිපියෙන් පිළිතුරු සපයා ඇති, පෙත්සමට **"E"** ලෙස ලකුණු කර ඇති 2009.05.05 දින දරණ ලිපිය ඔහු වෙත ලිවීමට, 2008.07.21 දින දරණ ඔබඋතුමාණන්ලාගේ අධිකරණයේ තීන්දුවේ, 8 වන වගඋත්තරකරුට එරෙහිව කර තිබුන බරපතල සහ දැඩි නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපණයන් පිළිබඳව දැනුවත් කර නොතිබූ ජනාධිපතිතුමා විසින් එතුමාගේ ලේකම්වරයාට නියම කිරීමට 8 වන වගඋත්තරකරු එතුමා පොළඹවා අවනත කරගෙන ඇති බව 22 වන වගඋත්තරකරු තරයේම විශ්වාස කරයි.

(ii) 8 වන වගඋත්තරකරුගේ පෙරකාලසිය ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට දැනුම් දී සිටියාසේම, ඉහත කී කාරනයන් පිළිබඳව ගරු නීතිපතිතුමා විසින් අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කළයුතුව තිබුන බව 22 වන වගඋත්තරකරු ඉතා ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කර සිටී.

(iii) *වෙනත් දේ අතර*, පහත දැක්වෙන නිගමනය ද අතුළත්, ව්‍යර්ථ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19 වන සංශෝධනය පිළිබඳව ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ 7න් සාමාජික විනිසුරු මඩුල්ල විසින් කරන ලද නිශ්චයෙහි සම්මත හරය කෙරෙහි 22 වන වගඋත්තරකරු විශ්වාසය තබයි.

> **"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සම්පූර්ණ ව්‍යුහය පුරාම දිවයන එක මූලධර්මයක් වේනම්, එය නීතියෙහි ආධිපත්‍යයේ වන මූල්‍යධර්මය වන අතර, රජයේ සියළුම ක්‍රියාකාරී අංග නීතියෙහි සීමාවන් ඇතුලත තැබීමේ සහ එමඟින් *<u>නීතියේ ආධිපත්‍යය තේරුම් සහිත කිරීමේ සහ බලදායී කිරීමේ කර්තව්‍ය පවරා ඇත්තේ අධිකරණය මතය</u>*" (ඉත්දියානු තඩු තීත්දුවේ උපුටා දැක්වීමකි) *(වැඩිමනත් සේ අවධාරණය කරමිනි)***

(h) **("22RX1")** තීන්දුවෙන් සාක්ෂි දරණ පරිදි, විස්තීරණ වාචික සහ ලිඛිත දේශණ ඉදිරිපත් කරමින් මෙම ඉල්ලීම සඳහා පෙත්සම්කරුට ක්‍රියාකාරී ලෙස සහයෝගය දැක්වූ 22 වන වගඋත්තරකරු *පෙරකී කාරණයන්ට අගතියක් නොවන පරිදි;*

(i) මෙහි මතු නියත ලෙසින්ම පිළිගනු ලැබ ඇති සම්ප්‍රකාශයන් හැර, 8 වන වගඋත්තරකරුගේ පෙත්සමේ සහ අනුරූපී දිවුරුම් ප්‍රකාශයේ සම්ප්‍රකාශයන් සමස්ථ වශයෙන් සහ එකින් එක වෙන වෙන්ව ප්‍රතික්ෂේප කර සිටින අතර,

(ii) ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය නොමග යැවීමේ හිතාමතාමවූ චේතනාවෙන්, 8 වන වගඋත්තරකරු දැන දැනම සහ උවමනාවෙන් ම වැදගත් සිද්ධිමය කාරණා වසන් කොට අසත්‍ය ප්‍රකාශ කර ඇති බව පිළිඹිඹුකර පෙන්වීම සඳහා පෙත්සමේ අඩංගු සම්ප්‍රකාශවලට සහ දිවුරුම් ප්‍රකාශයේ අනුරූප ජේදවලට ප්‍රතිචාරය දක්වා සිටී.

<u>**ප්‍රතිචාර**</u>

2. පෙත්සමේ 1 වන ජේදයෙහි සම්ප්‍රකාශයන් 22 වන වගඋත්තරකරු පිළිගනී.

3. පෙත්සමේ 2, 3, 4 සහ 6 ජේදයන්ට ප්‍රතිචාරය දක්වමින්, 22 වන වගඋත්තරකරු ගෞරවයෙන් යුතුව මෙසේ ප්‍රකාශ කර සිටී.

(අ) එහි කර ඇති ප්‍රකාශයන් **වැරදි සහගත සහ අසම්පූර්ණ** වන හෙයින්ම, ඒවා අසත්‍ය වන අතර, 8 වන වගඋත්තරකරු දැන දැනම ඕනෑකමින්ම ඒවා කර ඇත්තේ ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය හිතාමතාම නොමග යැවීමේ චේතනාවෙනි.

(ආ) (g), (h) සහ (i) ආයාචනයන් හි අයැද ඇති සහනයන් ප්‍රදානය කර ඇති බවට පෙත්සමේ 2 වන ජේදයේ ප්‍රකාශය සහ (o), (q) සහ (r) ආයාචනයන් හි අයැද ඇති සහනයන් ප්‍රදානය කර නැති බවට පෙත්සමේ 3 වන ජේදයේ කර ඇති ප්‍රකාශය උතුමාණන්ලාගේ අධිකරණය හිතාමතාම නොමග යැවීමේ චේතනාවෙන් දැන දැනම, උවමනාවෙන්ම සහ වෙස්ගැන්වීමකින් යුතුව කර ඇත.

(ඇ) 2008.07.21 දින දරණ සංක්ෂිප්ත තීන්දුව සහ එහි තියන නිගමනයන් සමස්ථ ලෙස කියවා බැලූ කල් හි, ඉහත කී ප්‍රකාශයන් <u>මුසාවක් බවට පත්වන බවත්</u> ඒ ගැන අධිකරණමය අවධානයකට ගතයුතු වන බවත් 22 වන වගඋත්තරකරු ගෞරවයෙන් යුතුව කියා සිටී.

> *2008.07.21 දින ප්‍රකාශයට පත්කරන ලද නඩු තීන්දුවේ සත්‍ය පිටපතක්, ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ පහසුව පිණිස අදාල ඡේදයන් ඉස්මතුකර ලකුණු කරමින් "22RX1" ලෙස ලකුණු කර මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසින් යා කොට ඇත.*

4. ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය හිතාමතාම නොමග යැවීමේ චේතනාවෙන් යුතුව, පහත දැක්වෙන වැදගත් සිද්ධිමය කාරණා ඔබ උතුමාණන්ලාගේ අධිකරණයෙන් 8 වන වගඋත්තරකරු විසින් **දැන දැනම සහ උවමනාවෙන් ම** <u>වසන්</u> කර ඇති බව 22 වන වගඋත්තරකරු පෙත්සමේ 2, 3, 4 සහ 6 ඡේදයන්ට වැඩිදුරටත් ප්‍රතිචාරය දක්වමින් කියා සිටී.

(a) 2008.07.21 දින ප්‍රකාශයට පත් කරන ලද (**"22RX1"**) නඩු තීන්දුවේ 69 පිටුවේ අවසන් ඡේදයේ ඔබ උතුමාණන්ලාගේ අධිකරණය මෙසේ ප්‍රකාශ කර ඇත.

> **"ඉහත දක්වා ඇති නිගමනයන්ගේ පදනම මත මෙම නීතිඥතයෙහි සියළුම පාර්ශවයන් විසින් අවශ්‍ය ක්‍රියා කටයුතු කළයුතුය."**

(b) මෙම නඩුවේ, 2008.07.21 දින තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, දින කීපයක්ම, එනම් 2008.08.08, 2008.09.29, 2008.10.08, 2008.10.20 සහ 2008.12.15 දිනයන් හි ගැනුන අතර, 2008.12.15 දින නීති කෘතීන් **<u>අවසන්</u>** කරන ලදි.

(c) ඉහත කී දිනයන් හි ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් යුක්ති සහගත සහ සාධාරණීය සහන ප්‍රදානය කරමින් නියමයන් කර ඇත.

(d) 29, 30, 25 සහ 31 වන වගඋත්තරකරුවන්ට ඒ පිළිබඳව දැනුම්දීම් කර තිබියදීත්, එතකදුවුවත්, කිසිදු ක්‍රියා මාර්ගයක් ඔවුන් විසින් ගෙන නොමැති බව, *වෙනත්දේ අතර* පෙත්සම්කරුගේ නීතිඥ විසින් 2008.07.08 වන දින ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට දන්වා සිටින ලදුව, 2008.09.29 දිනට ඔවුන්ට නොතිසි නිකුත් කරන ලෙසට ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අණ කරන ලදි.

(e) 2008.09.08 වන දිනම පෙත්සම්කරුගේ නීතිඥ මෙසේ පෙන්වා දී සිටින ලදි.

> **"ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ඔහුට විරුද්ධව ප්‍රතිවාදී නිගමනයන් කර තිබූන 8 වන වගඋත්තරකරු, ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය කර ඇති බව සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 53 ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර ඔහු විසින් දී තිබූන ප්‍රතිඥාව කඩ කිරීම හේතුකොටගෙන, රාජ්‍ය තිලයන් දැරීමට නුසුදුස්සකු බවට පත්ව ඇති බවටත් වූන එම නිගමනයන් වීමේ සිද්ධාන්තය ද නොතකමින්, ඔහු දිගටම රාජ්‍ය තනතුරු දැරීම කරගෙන යයි."**

(f) **2008.09.29** දින ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් නියෝගයන් කීපයක් කරමින් *වෙනත් දේ අතර,* නීතියේ ආධිපත්‍ය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නීතියෙන් සමානාත්මක රැකවරණය බලාත්මක කිරීම සඳහා තීන්දුවේ පදනම මත පියවර ගන්නා ලෙසට,

- පොලිස්පති - **28** වන වගඋත්තරකරුට
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති - **29** වන වගඋත්තරකරුට
- අල්ලස් කොමිසමේ සභාපති - **30** වන වගඋත්තරකරුට
- ගරු නීතිපතිට - **31** වන වගඋත්තරකරුට

විධානය කර සිටින ලද අතර, මේ සම්බන්ධයෙන් **22** වන වගඋත්තරකරුගේ **2008.09.29** දින දරණ ලිඛිත නියෝජනයන් අතිරේක සොලිසිටර් ජනරාල්වරයාට දෙන ලෙස නියම කරන ලදුව (එහි පිටපතක් ඔහුට දෙනු ලැබ) යම් වැරදි ක්‍රියාවන් සිදුකර ඇතිදැයි සොයා දැනගනු පිණිස ඔබ උතුමාණන්ලාගේ විසින් කර තිබූ නිගමනයන් හි පදනම් මත අදාළ නීතිවල නියමයන් ප්‍රකාර පියවර ගන්නා ලෙසට වගඋත්තරකරුවන්ට විධානය කරමින් වගඋත්තරකරුවන් විසින් ගනුලබන පියවර පිළිබඳව ඔබ උතුමාන්ලාගේ අධිකරණයට දැනුම් දී සිටින ලෙසට අතිරේක සොලිසිටර් ජනරාල්වරයාට නියම කරන ලදී.

(g) **2008.09.29** දින ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් මෙසේ ද සටහන් කර ඇත.

> **"පෞද්ගලික පාර්ශවයකට ප්‍රතිලාභ පිරිනැමීමෙන්, 8 වන වගඋත්තරකරු නීතියට එරෙහිව මහජන අයිතීන්ට එරෙහිව නීතියට පටහැනිව ක්‍රියා කර ඇති බවට අධිකරණය දැඩි නිගමනයන්ට එළඹී ඇති අතර, සහ අධිකරණය විසින් එළඹ ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් ඔහු උල්ලංඝනය කර ඇති බවටත් අධිකරණය දැඩි නිගමනයකට එළඹ තිබියදී, ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැහැසි ලෙසට උල්ලංඝනය කර ඇති බව මෙම නිගමනයන්ගෙන් පැහැදිලිවම පෙනී යන්නේ වී නමුත්, එය නොතකමින්, 8 වන වගඋත්තරකරු තවමත් දිගින් දිගටම රාජ්‍ය තිලයන් දරන්නේ ය."**

(h) **2008.09.29** දිනම **8 වන වගඋත්තරකරු** වෙනුවෙන් පෙනී සිටි **අතිරේක සොලිසිටර් ජනරාල්වරයා 8 වන වගඋත්තරකරුගේ පෙරකලාසිය නීතිපති විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව දන්වා සිටීමෙන්,** ඒ අනුව, 8 වන වගඋත්තරකරුගේ පෙත්සමේ 9 වන ඡේදයේ දැක්වෙන කරුණු එළිදරව් කිරීමට, ඊළඟ දිනයට 8 වන වගඋත්තරකරුට කෙළින්ම නොතිසි නිකුත් කරන ලෙස ගරු ඔබතුමාණන්ලාගේ අධිකරණය විසින් අණ කරන ලද අතර, ***දැන් කිසිදු නියමිත පාර්ශවයකට පෙනී නොසිටින බැවින් මෙම කාරණය සම්බන්ධයෙන් අධිකරණයට සහයදී සිටින ලෙසට නීතිපතිවරයාට නියම කෙරුණි.***

*2008.09.08 සහ 2008.09.29 දිනයන් හි නීති කෘතීන්වල සහ **22 වන වගඋත්තරකරුගේ 2008.09.29 දින දරණ ලිඛිත නියෝජනයන්** හි සහ 2008.10.08, 2008.10.20 සහ 2008.12.15 දින දරණ නීති කෘතීන්වල සත්‍ය පිටපත් සංක්ෂිප්ත ලෙස **"22RX2"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස මෙයට යාකොට ඇත.*

(i) **2008.10.08** වන දින **8** වන වගඋත්තරකරුගේ නව නීතිඥවරයා, *වෙනත් දේ අතර,* සැලකිරීම කර සිටියේ ය.

නීති කෘතීන්වල අදාළ කොටස පහත උපුටා දැක්වේ.

> **"මෙම අධිකරණයේ තීන්දුවෙන් පසුව කාර්ය භාරයන් හි දිගටම නිරතවීම ගැන නිරපේක්ෂ ලෙස සමාව අයැදීමක් 8 වන වගඋත්තරකරු අධිකරණයට කර සිටින බව ඔහු වැඩිදුරටත් සැලකර සිටී. එමනිසා, එම කණගාටුව ප්‍රකාශ කිරීම සහ කෙලින්ම හෝ අනියම් ලෙසින්වත් කුමන රාජ්‍ය ආයතනයක මොනයම් තිල තානාන්තරයක් හෝ නොදරණ බවට හෝ කිනම් ආකාරයකින්වත් විධායක හෝ පරිපාලනමය කාර්ය කටයුත්තක නොයෙදෙන බවට ද තරයේ ප්‍රකාශ කිරීමක් ද ඇතුළත් කිරීම සලකා බැලිය හැකි, යෝග්‍ය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට 8 වන වගඋත්තරකරුට කල් දෙනු ලැබේ."**

(j) **2008.12.15 දින නීති කෘතීන් බලන්න. අතිරේක සොලිසිටර් ජනරාල් විසින්**, *වෙනත් දේ අතර,*

- පවත්වාගෙන යනු ලබන විමර්ශනයන් හි බොහෝදුරට ප්‍රගතියක් සිදුවී ඇති බවට දැක්වෙන අල්ලස් සහ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සභාපතිගේ 2008.12.05 දින දරණ ලිපිය.
- නීතිපතිතුමාගේ උපදෙස් පතමින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් එවන ලද 2008.12.15 දින දරණ ලිපිය ද

ඉදිරිපත් කර ඇත.

5. ඉහත **4** ජේදයේ දැක්වෙන වැදගත් සිද්ධිමය කාරණා වසන් කිරීම සහ ඉහත **3** ජේදයේ දැක්වෙන නොමග යවන සුළු නියෝජනයන් හොඳාකාරවම සහ සැබැවින්ම පිළිඹිඹු කර පෙන්වන්නේ සහ පරිමාමතිකව කියා පාන්නේ, **8** වන වගඋත්තරකරු විසින් සිය පෙත්සමේ **5** ජේදයේ, වඩාත් විශේෂයෙන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අනුරූප **6** ජේදයේ කර ඇති, මෙහි පහත **8** ජේදයේ උපුටා දක්වන, ප්‍රකාශය ප්‍රත්‍යක්ෂ ලෙසින්ම අසත්‍ය බවය – එනම්,

> **"මාගේ (එනම් 8 වන වගඋත්තරකරුගේ) මුළු රාජ්‍ය සේවා කාලය පුරාම, උපරිම මට්ටමින් සත්‍යවාදිභාවය සහ අවංකත්වය පවත්වාගෙන ගොස් ඇත. ......... රටේ උපරිම යහපත තකා අතිශ්‍යය කැපවීමකින් යුතුව රාජකාරි කටයුතු ඉටුකළ අතර, මහජන යහපත මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත."**

6. පෙත්සමේ **4** ජේදයට වැඩිදුරටත් ප්‍රතිචාරය දක්වමින්, **22** වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටී,

(a) 2008.07.21 දින දරණ ("22RX1") නඩු තීන්දුවෙන් විස්තීරණ ලෙස සාක්ෂි දරණ පරිදි, ගරු ඔබතුමාණන්ලාගේ අධිකරණය විසින් ඔහුගේ කල් ක්‍රියාව සහ ක්‍රියාදාමයන් උග්‍ර ලෙස දෝෂාරෝපණයට ලක් කරමින් 8 වන වගඋත්තරකරුට එරෙහිව බැරෑරුම් ප්‍රතිවාදි වූ අහිතකර නිගමනයන් කර ඇති අතර, ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ඔහුට අණ කළ ප්‍රකාර, 8 වන වගඋත්තරකරු විසින් රජයට වන්දි වශයෙන් රු. 500,500/- ක් ගෙවන ලදි.

(b) ඔහුගේ පෙත්සමට "D" ලෙස ලකුණු කර ඇති 2008.10.16 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට කණගාටුව ප්‍රකාශ කිරීම සහ නිරපේක්ෂ සමාව අයැදීමක් කිරීම සහ එවැනි දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර සිටීමෙන්, 2008.07.21 දින දරණ ඔබ උතුමාණන්ලාගේ ("22RX1") නඩු තීන්දුවේ එකී බරපතල සහ බැරෑරුම් ප්‍රතිවාදි අහිතකර නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපණයන් සම්බන්ධයෙන් 8 වන වගඋත්තරකරුගේ වගකීම සහ ඔහු අත වරද පැහැදිලිවම පිළිගැනීමක් ප්‍රත්‍යක්ෂ ලෙසින්ම පිළිඹිඹු කර දැක්වීමකි.

(c) අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි මස දී දෙදිනක් පුරා 22 වන වගඋත්තරකරුගේ කට උත්තරය සටහන් කරගත් අතර, දැන් එම විමර්ශන සමාප්ත කර යම් පුද්ගලයින්ට එරෙහිව කෙටි කලකදී නඩු පවරනු ඇති බව 22 වන වගඋත්තරකරු තරයේම විශ්වාස කරයි ; මේ ගැන 30 වන වගඋත්තරකාර එම කොමිෂන් සභාවේ සභාපති සහ 31 වන වගඋත්තරකාර ගරු නීතිපති තුමා විසින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ දැනගැනීමට ලක් කර සිටිය හැකිය.

(d) ඔහුගේ කට උත්තරය සටහන් කළාසේම, 8 වන වගඋත්තරකරුගේ සහ සම්බන්ධිත අනිකුත් අයවළුන්ගේ ද කටඋත්තර, ඉහත සඳහන් පරිදි, සටහන් කර ගන්නට ඇතැයි 22 වන වගඋත්තරකරු තරයේ ම විශ්වාස කරයි. **වෙසෙසින්ම, 8 වන වගඋත්තරකරු මෙම අදාල සහ වැදගත් සිද්ධිමය කාරණයන් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට වසන් කර ඇත.**

(e) අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලබන විමර්ශනයන් පිළිබඳ ප්‍රගතිය ගැන 22 වන වගඋත්තරකරු නොදනී. 28 වන වගඋත්තරකාර - පොලිස්පති, 29 වන වගඋත්තරකාර - අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති සහ 31 වන වගඋත්තරකාර ගරු නීතිපති විසින් ඒ ගැන දැනුවත් කිරීමක් කර සිටිය හැක.

7. (a) i) වාර්තා ලේඛණ/සාක්ෂි සුරක්ෂිත කිරීම සහතික කිරීමට සහ බාධාවකින් තොරව විමර්ශන කටයුතු පැවැත්වීම සඳහා, වැඩකරන ස්ථානයෙන් එවැනි නිලධාරියකු බැහැර කිරීමෙහිලා, සුළු චෝදනාවන්ට පවා ලක් රජයේ සේවකයකුගේ වැඩ අත්හිටුවනු සහ/හෝ නහනම් කරනු ලැබේ.

ii) වඩාත් වෙසෙසින්ම රටෙහි උසස්මතම අධිකරණය වන, ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කර ඇති බරපතල සහ බැරෑරුම් නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපණයන් අභිමුඛයෙහි, එවැනි නියත ක්‍රියා පිළිවෙතට (පරිචයට) ව්‍යාතිරේඛයක් (Exception) විය නොහැක.

(b) "ඉන්ධන මිල අඩුවීම සඳහා ඇවුරුම්" ගිවිසුම් (Oil Hedging Agreements) යනුවෙන් ව්‍යාජ වෙස් ගැන්වීමකින් සඳහන් කර ඇති ගනුදෙනු, ජාතික සහ මහජන අයිතීන් අරබයා අභියෝගයට ලක් කරමින් 22 වන වගඋත්තරකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) ඉල්ලීම අංක. SC (FR) 404/2009 සහ SC (FR) 481/2009 ඉදිරිපත් කර ඇත.

(c) 8 වන වගඋත්තරකරු එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් "ඉන්ධන මිල අඩුවීම සඳහා ඇහුරුම්" (Oil Hedging) පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත්කොට, ඉන් අනතුරුව 2006 නොවැම්බර් මස දී එම කමිටුවේ වාර්තාව පදනම් කොට ගෙන 2007 ජනවාරි මසදී අමාත්‍ය මණ්ඩලයට නිර්දේශයක් කිරීම සිදුකරන ලදි. එහි ප්‍රතිඵලය වූයේ, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ රජයට එරෙහිව අතිවිශාල විදේශ විනිමය ඉල්ලීම් නොවැලැක්විය හැකියේ කර සිටීම ගෙන දෙන්නාවූ, මෙම සැක කටයුතු ගනුදෙනුවලට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුලත්වීම ය.

(d) ඊට සම්බන්ධිත විදේශ බැංකු 3 ක් විසින් දැනටමත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව සහ මහාභාණ්ඩාගාරයේ ලේකම් විසින් නියෝජනය වන රජයට එරෙහිවත්, විදේශ අධිකරණ බල ප්‍රදේශයන් හි බේරුම්කිරීම/නඩුකරයන් පවරා ඇති බව ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට එළිදරව් කර ඇත.

(e) මහජන අයිතීන් අරබයා මහජන අයිතීන් වෙනුවෙන් ක්‍රියා කටයුත වල සහ/හෝ නඩුකීමේ කාර්ය්‍යයන් හි 22 වන වගඋත්තරකරු නියැලී සිටින බව මහ ජනයා දන්නා පොදුවේ දන්නා කාරණයක් වන අතර, ඒ හේතු තත්වයන් අනුව, 22 වන වගඋත්තරකරුට තැපැල් සහ වෙනත් මාර්ගයන් මගින් නම් එළිදරව් කල සහ එළිදරව් නොකල පුද්ගලයින්ගෙන් වංචා, දූෂණ සහ අනිකුත් අයුතු ක්‍රියාවන්ට අදාලව විවිධ තොරතුරු සහ ලේඛණ ලැබේ.

(f) දුරකථන පණිවිඩයකින් කලින් දන්වා සිටින ලදුව "ඉන්ධන මිල අඩුවීම සඳහා ඇහුරුම් ගනුදෙනු" (Oil Hedging Deals) යයි කියනු ලබන ගනුදෙනු වලට මූලික ලෙස සම්බන්ධ එක බැංකුවක් වන ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවේ ප්‍රධාන විධායකගේ යයි කියනු ලබන අංක. 0773-660660 දරණ දුරකථනයේ දුරකථන බිල්පත්වල විස්තර උද්ධෘත මෑතක දී 22 වන වගඋත්තරකරුට තැපැලෙන් ලැබුණි.

(g) 2009 මාර්තු, අප්‍රේල් සහ මැයි යන මාසවල දින කිපයකදීම අංක. 0777-576070 දරණ දුරකථනයට ඉහත අංකය දරණ දුරකථනයෙන් වෙසෙසින්ම දිවා හෝජන වේලාවට ඉතාමත්ම පෙර පාහේ හෝ සැන්දෑවේ අමතා ඇති බව දුරකථන බිල්පත් උද්ධෘතවලින් එළිදරව් වේ. මෙම දුරකථන අංකය 8 වන වගඋත්තරකරුගේ වන බව 22 වන වගඋත්තරකරු දැන සිටී.

(h) අංක.0773-647353 දරණ දුරකථනය "ඉන්ධන මිලේ පහත වැටීම ඇහුරුම් කිරීමේ ගනුදෙනු" (Oil Hedging Deals) යැයි කියනු ලබන ගනුදෙනුවලට සම්බන්ධිත තවත් විදේශ බැංකුවක් වන සිටි බැකුවේ ප්‍රධාන විධායක නිලධාරි තැනගේ වන බවද, දුරකථන ඇමුතුම දුන් තැනැත්තා විසින් 22 වන වගඋත්තරකරුට දන්වා සිටින ලදී. අංක.0777-576070 (8 වන වගඋත්තරකරුගේ) දුරකථනයට දෙන ලද ඇමතුම්වලින් අනතුරුව, ඉහත සඳහන් අංක.0773-660660 දරණ දුරකථනයෙන් අංක.0773-647353 දරණ (එනම් සිටි බැංකුවේ ප්‍රධාන විධායකගේ ) දුරකථනයට ඇමතුම් කර ඇති බව, දුරකථන බිල්පත් උද්ධෘතවලින් එළිදරව් වේ.

(i) ඉහත කී දුරකථන බිල්පත් උද්ධෘත බැලූ බැල්මටම සැක රහිත බව පැහැදිලිව පෙනී යතත්, එතකදුවත් ඒවායේ විශ්වාසනීයභාවය නීති බලාත්මක කිරීමේ නිලධාරීන් මඟින් පිරික්සුම් කරවා ගන්නා ලෙසට 22 වන වගඋත්තරකරු ඔබ උතුමන්ලාගේ අධිකරණයට ඉතා ගෞරවයෙන් යුතුව ආයාචනය කර සිටී.

(j) එම දුරකථන බිල්පත් විශ්වාසනීය වන බවට ඔප්පු වුවහොත්, එවිට 8 වන වගඋත්තරකරු සහ ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුව අතර "බන්ධනයක්"/වංක සහයෝගයක් ඇති බවට එමඟින් අනාවරණය වන අතර, මෙය ඔවුන්ට ප්‍රතිවාදී ලෙස දැනට පවත්නා සහ "ඉන්ධන මිල අඩුවීම වලක්වාලීමේ ඇහුරුම් ගනුදෙනු" (Oil Hedging Deals) යැයි කියනු ලබන ගනුදෙනු අභියෝගයට ලක් කර දැනට පවතින 22 වන වගඋත්තරකරුගේ ශ්‍රේෂ්ඨාධිකරණ අංක.SC (FR) 404 සහ 481 දරණ ඉල්ලීම්වලට වැදගත් වන්නේය.

(k) ඔබ උතුමණන්ලාගේ අධිකරණයේ (22RX1) නඩු තීන්දුවේ 8 වන වගඋත්තරකරුට එරෙහිව කර ඇති බරපතල සහ බැරෑරුම් නිගමනයන් හා උග්‍ර දෝෂාරෝපණයන් අභියස, රාජ්‍ය තානාන්තර දැරීමට ඔහු සුදුසු හා නිසි පුද්ගලයකු නොවන බවට ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් නිගමනය කරන ලදී.

(l) ඉහත කී දුරකථන බිල්පත් උද්ධෘත සත්‍ය සහ විශ්වාසනීය වන බවට සොයාගනු ලැබුවහොත්, එවිට 8 වන වගඋත්තරකරු, රාජ්‍ය තානාන්තර, සියල්ලටම වඩා මහා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් තනතුරු දැරීමට සුදුසු සහ නිසි පුද්ගලයකු නොවන බව වැඩිදුරටත් තහවුරු වනු ඇත.

(m) 22 වන වගඋත්තරකරුගේ අංක.SC (FR) 404 සහ 481 දරණ ඉල්ලීම්වල කර ඇති එළිදරව් අනුව සහ 22 වගඋත්තරකරුට විශ්වාසනීය ලෙස දැනගන්නට ලැබී ඇති පරිද්දෙන්, ඉන් පළමු ඉල්ලීම කිරීමෙන් සුළු කලකට පසු, "ඉන්ධන මිල පහත වැටීම වලක්වාලන ඇහුරුම් ගනුදෙනු" (Oil Hedging Deals) යැයි කියා පාන ගනුදෙනු ගැන අපරාධ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයන් ආරම්භ කිරීම අභියස, එවැනි රාජ්‍ය තානාන්තරයන් දැරීමට 8 වන වගඋත්තරකරු නුසුදුස්සකු වන බවට පත්වනවා ඇත.

*එකී දුරකථන බිල්පත් උද්ධෘතවල, 2006.11.16 දිනැති ලිපිය මගින් 8 වන වගඋත්තරකරු ඉදිරිපත් කර ඇති අධ්‍යයන කණ්ඩායමේ වාර්තාවේ, කැබිනට් පත්‍රිකාවේ සහ 2007 ජනවාරි මස කැබිනට් මණ්ඩලයේ තීරණයේ සත්‍ය පිටපත් ඒකරාශී ලෙස **"22RX3"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

8. 8 වන වගඋත්තරකරුගේ පෙත්සමේ 5 ජේදයට වඩාත් විශේෂයෙන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අනුරූපී 6 ජේදයට ප්‍රතිචාරය දක්වමින් 22 වන වගඋත්තරකරු මෙසේ කියා සිටී;

(a) අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්ට පිටපතක් සහිතව 8 වන වගඋත්තරකරු විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලද ඔහුගේ පෙත්සමට "A" ලෙස ලකුණු කර ඇති <u>2008.07.25</u> දින දරණ ලිපියෙන් පහත උපුටා දක්වා ඇති ජේදයේ ඔහු උද්දේශිතව කියා පාන අන්දමට, 8 වන වගඋත්තරකරු ක්‍රියා කර ඇතැයි යන්න 22 වන වගඋත්තරකරු ඒකාන්ත ලෙසින් ප්‍රතික්ෂේප කර සිටී.

> **"මාගේ (එනම් 8 වන වගඋත්තරකරුගේ) මුළු රාජ්‍ය සේවා කාලය පුරාම, උපරිම ,මට්ටමින් සත්‍යවාදිභාවය සහ අවංකත්වය පවත්වාගෙන ගොස් ඇත. ......... රටේ උපරිම යහපත තකා අතිශය කැපවීමකින් යුතුව රාජකාරි කටයුතු ඉටුකල අතර, මහජන යහපත මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත."**

(b) *විස්මිත* ලෙස 8 වන වගඋත්තරකරුගේ <u>2008.07.25</u> දිනැති ඉහත කී ලිපිය, 2008 ඔක්තෝබර් මස ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට 2008 ඔක්තෝබර් මස ඉදිරිපත් කර ඇති 2008.10.16 දින දරණ ඔහුගේ ("D") දිවුරුම් ප්‍රකාශයට ඔහු අමුණා නැති අතර එමගින් <u>ඔහු විසින් එම අවස්ථාවේදී එම ලිපිය ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට දැන දැනම සහ උවමනාවෙන්ම වසන් කොට ඇත.</u>

(c) **8 වන වගඋත්තරකරු විසින් යවන ලද** එකී <u>2008.07.25</u> දින දරණ ("A") ලිපියේ අවසන් ජේදයේ, එනම් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ <u>2008.07.21</u> දින නඩු තීන්දුවට දින 4 කට පසුව 8 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර ඇත.

> "LMSL ගනුදෙනුව පිළිබඳව **<u>මාධ්‍යයට ප්‍රකාශිත විවිධ මතයන්</u>** සැලකිල්ලට ගනිමින්, PERC ආයතනයේ සභාපති වශයෙන් මෙම ගනුදෙනුවට මාගේ සහභාගිත්වය පිළිබඳව පැහැදිලි කිරීම් සමහරක් මෙහි බහාලමි."
> (අවධාරණය වැඩිමනත් ලෙස)

(d) 8 වන වගඋත්තරකරු <u>2008.07.25</u> දින දරණ ("A") ලිපියෙහි කියාපා ඇත්තේ <u>මාධ්‍යයෙහි ප්‍රකාශිත විවිධ මත පිළිබඳව</u> මිස, ඊට පෙරාතුව <u>2008.07.21</u> දින ප්‍රකාශයට පත් **("22RX1") නඩු තීන්දුවේ ඔහුට විරුද්ධව ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කර තිබුන බරපතල සහ බැරෑරුම් නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපණයන්** ගැන නොවේ.

(e) **ඉතා වෙසෙසින්ම** ඉහත කී ලිපියට බහලු ඉහත කී "කරුණු පැහැදිලි කිරීම" 8 වන වගඋත්තරකරුගේ පෙත්සමට "A" ලෙස ලකුණු කර ඇති ලේඛණයට පවා අමුණා නැති අතර, එමගින් එම ලේඛණය **අසම්පූර්ණ ලේඛණයක්** බවට අනුවර්තනය වේ.

(f) **දැන් ද පවා, එකී "කරුණු පැහැදිලි කිරීම" යැයි කියාපාන කරුණු පැහැදිලි කිරීම 8 වන වගඋත්තරකරු විසින් දැන දැනම සහ උවමනාවෙන්ම ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයෙන් වසන් කොට ඇත.**

(g) මෙහි ඉහත 7(a) ජේදයේ උපුටා දක්වා ඇති 8 වන වගඋත්තරකරුගේ 2008.07.25 (A) ලිපියේ 3 වන ජේදයේ ඔහු විසින් කර ඇති ප්‍රකාශයේ නිවැරදිතාවය වෙසෙසින්ම ජනාධිපතිතුමාගේ ලේකම්ගේ 2008.07.31 (B) ලිපියෙන් සහ 2008.09.17 (C) ලිපියෙන් ද අනාවරණය වන පරිදි, ජනාධිපතිතුමාගේ ලේකම් විසින් හෝ අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ පිළිගෙන නොමැත.

9. 8 වන වගඋත්තරකරු විසින් ප්‍රතිඥාදීමක් යටතේ ගරු ඔබතුමාණන්ලාගේ අධිකරණයට කර ඇති මෙහි **ඉහත 8(a) ජේදයේ සඳහන් ප්‍රකාශය මුසාවක් වන බවට පත් කෙරෙන 8 වන වගඋත්තරකරුගේ කල් ක්‍රියාවන්** සහ ක්‍රියාදාමයන් පිළිබඳව අවස්ථා කීහිපයක් 22 වන වගඋත්තරකරු විසින් මෙහි පහත 14 ජේදයේ ගෙනහැර දක්වා ඇති අතර මෙය අධිකරණමය අවධානයකට ගත යුත්තක් වන බව 22 වන වගඋත්තරකරු ගෞරවයෙන් යුතුව කියා සිටී.

10. පෙත්සමේ 7, 8, 9, 10, 11, 12, 13 සහ 14 ජේදයන්ට ප්‍රතිචාරය දක්වමින් 22 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටී.

(a) ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය නොමග යැවීමේ චේතනාවෙන් යුතුව 8 වන වගඋත්තරකරු දැන දැනම සම්පූර්ණ සහ පරිසමාප්ත එළිදරව්වක් කිරීමට අසමත් වී ඇති අතර, එමගින් ඉහත කී ජේදයන් හි ප්‍රකාශයන් මුසාවක් වන බවට පත් කෙරෙති.

(b) ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ (22RX2) ලෙස ලකුණු කර ඇති නීති කෘතීන් වාර්තාව පමණක් 22 වන වගඋත්තරකරු පිළිගනී.

11. පෙත්සමේ 15, 16 සහ 17 ජේදයන්ට ප්‍රතිචාරය දක්වමින් 22 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටී.

(a) 8 වන වගඋත්තරකරුට එරෙහිව ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කර තිබුණු නොයෙකුත් බැරෑරුම් සහ බරපතල නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපනයන් පිළිබඳව ජනාධිපතිතුමාගේ ලේකම්ව හෝ අතිගරු ජනාධිපතිතුමාව නිවැරදිව සහ සම්පූර්ණ ලෙස දැනුවත් කල නොතිබුණු බවට සහ/හෝ 8 වන වගඋත්තරකරු විසින් එම අයව වැරදි කරුණු කියාපෑමක් සහ/හෝ ඔවුන්ව නොමග යැවීමක් කර ඇති බවට 22 වන වගඋත්තරකරු තරයේ ම විශ්වාස කරයි.

(b) ඉහත 9 වන ජේදයේ ගෙනහැර දක්වා ඇති කරුණු මගින් මෙය ඉමහත්සේ තහවුරු වේ.

(c) පෙත්සමට (F) ලෙස ලකුණු කර ඇති 8 වන වගඋත්තරකරුගේ 2009.06.03 වන දින දරණ ලිපියේ 3 වන ජේදයේ පහත දැක්වෙන වාක්‍යයෙන් ඉහත සඳහන් අයවළුන්ට 8 වන විත්තිකරු විසින් වැරදි කරුණු කියාපෑම සහ/හෝ ඔවුන් නොමග යැවීම තවදුරටත් තහවුරු වෙයි. එනම්,

> *"අධිකරණය විසින් සියළු අදාළ වැදගත් කරුණු කාරණා සැලකිල්ලට ගතහොත් මට විරුද්ධව ප්‍රතිවාදී වූ නිගමනයන් විය නොහැකි යයි, එකී තඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව මෙම සම්බන්ධතාවයෙන්, මාගේ නීතිඥයින් විසින් මට උපදෙස් දී ඇත."*

(d) සියළුම සිද්ධිමය කාරණයන් ඔබ උතුමාණන්ලාගේ අධිකරණය ඉදිරියේ දක්වා සිටීමට අවස්ථාවක් 8 වන වගඋත්තරකරු නියෝජනය කළ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාට සලසා දෙනු ලැබීමෙන්, 2008.07.21 දින දරණ (22RX1) තඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව, 8 වන වගඋත්තරකරුගේ දිවුරුම් ප්‍රකාශය ද ඇතුළුව එම සිද්ධිමය කරුණු කාරණා ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් පරීක්ෂා කර බලා ඇති බැවින්, ඉහත කී ප්‍රකාශය ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට කරන්නා වූ නිග්‍රහයක් වන්නේ ය.

(e) ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් 2008.07.21 දින තඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙර, **සැලකිල්ලට ගෙන නොමැත්තේ කුමන වැදගත් සිද්ධිමය කරුණු කාරණා දැයි ගෙනහැර නොපාමින්** 8 වන වගඋත්තරකරු විසින් ඉහත කී නොහික්මුන සහ නොමග යැවීමේ ප්‍රකාශය කර ඇත.

(f) <u>දැන් 2009.06.03 වන දින,</u> 2008.07.21 වන දින එම තඩු තීන්දුව දී **<u>වසරකට ආසන්න කාලයකට පසු</u>**, විස්මිතව අතිගරු ජනාධිපතිතුමාට සහ එතුමාගේ ලේකම්තුමාට වැරදි කරුණු කියාපෑමට සහ/හෝ ඔවුන් නොමග යැවීමට, කිසිදු හරයකින් තොරව, 8 වන වගඋත්තරකරු ඉහත සඳහන් පරිදි වාචාල ලෙස කියා සිටී.

(g) ඇත්ත වශයෙන් ම, 8 වන වගඋත්තරකරු ඉහත කී ප්‍රකාශය මගින් වසරක් පමණ වන කලකට පසුව ද වුවත් 2008.07.21 දින (22RX1) තඩු තීන්දුවේ ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ඔහුට විරුද්ධව ප්‍රතිවාදී වූ නිගමනයන් කර ඇති බව ඔහු පිළිගනී.

(h) මෙහි ඉහත ගෙනහැර දක්වා ඇති පරිදි වූ 8 වන වගඋත්තරකරුගේ කල්ක්‍රියාව, ඔහු විසින් පෙත්සමේ 5 වන ජේදයේ, වඩාත් විශේෂයෙන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අනුරූපී 6 වන ජේදයේ ඔහු විසින් කර ඇති පහත දැක්වෙන ප්‍රකාශය මිත්‍යාවක් බවට පත් කෙරෙති එනම්,

> **"මාගේ (එනම් 8 වන වගඋත්තරකරුගේ) මුළු රාජ්‍ය සේවා කාලය පුරාම, උපරිම මට්ටමින් සත්‍යවාදීභාවය සහ අවංකත්වය පවත්වාගෙන ගොස් ඇත. .......... රටේ උපරිම යහපත තකා අභියෝග කැපවීමකින් යුතුව රාජකාරී කටයුතු ඉටුකළ අතර, මහජන යහපත මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත."**

12. පෙත්සමේ 18 වන ජේදයට ප්‍රතිචාරය දක්වමින් 22 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටී.

(a) 8 වන වගඋත්තරකරුගේ ඉල්ලීම නීතියෙහිලා වැරදි අවබෝධයකින් යුතුව වන සහ අධිකරණමය බලයකින් තොරව කරන ලද්දකි.

(b) **කිසිවකු නීතියේ ආධිපත්‍ය ඉක්මවා නොයන බවට වූ මතය ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් තරයේම දරා ඇති බැවින්, ව්‍යතිරේඛකයකින් තොරව, රටේ මුදල් භාරව උසස් රාජ්‍ය නිල තනතුරක් දැරූ 8 වන වගඋත්තරකරුට විරුද්ධව නීතියේ නියමයන් ප්‍රකාර දැඩි ලෙස කටයුතු කළ යුතු වන බවට, ජාතික සහ මහජන අයිතීන් බල කර සිටිනු ලැබේ.**

(C) පසුව කළ ප්‍රතිඥාවක් සැලකිල්ලට නොගනිමින් කරන ලද **ප්‍රතිඥාවක්** මත, කලින් ජනාධිපතිතුමාගේ නිල කාලය පවා ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අවසන් කළ අතර, මේ අවස්ථාවේ දී ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියකු වූ 8 වන වගඋත්තරකරුට එරෙහිව බැරුරුම් සහ බරපතල ප්‍රතිවිරෝධී නිගමනයන් සහ උග්‍ර දෝෂාරෝපණයන් සහිතව වන සහ ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට **දිවුරුම් ප්‍රකාශයක්** මගින් කණගාටුව ප්‍රකාශ කිරීම සහ සමාව අයැදීම සහ පොරොන්දුවක් දීම ද සහිත වන්නා වූ සිද්ධිමය කරුණු කාරණා වඩාත්ම සහ ඊටත් බොහෝ සෙයින් ම බරපතල සහ බැරුරුම් වන්නෝ ය.

13. පෙත්සමේ 19 වන ජේදයට ප්‍රතිචාරය දක්වමින් 22 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටි.

(a) ඔහු විසින් දියයුතුව තිබුණ පරිදි, පෙත්සම්කරුට සහ සියළුම වගඋත්තරකරුවන්ට දැනුම්දීමක් කිරීමට 8 වන වගඋත්තරකරු ඕනෑකමින්ම මගහැර ඇත.

(b) එම ප්‍රමාද දෝෂය ගැන 22 වන වගඋත්තරකරු විසින් පෙන්නාදෙන ලදුව, 8 වන වගඋත්තරකරු විසින් සියළු වගඋත්තරකරුවන්ට නොතිසි දෙන ලෙසට ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අණ කරන ලදි.

14. (a) 8 වන වගඋත්තරකරුගේ පෙත්සමට (A) ලෙස ලකුණු කර ඇති, පහත සඳහන් උද්ධෘතය අඩංගු ඔහුගෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත එතුමාගේ ලේකම් වෙත පිටපතක් ද සහිතව වූ <u>2008.07.25</u> වන දින දරණ ලිපිය අඩංගු පෙත්සමේ 5 වන ජේදයට, වඩාත් විශේෂිතව ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ජේදයට වැඩිදුරටත් ප්‍රතිචාරය දක්වමින්,

> **"මාගේ (එනම් 8 වන වගඋත්තරකරුගේ) මුළු රාජ්‍ය සේවා කාලය පුරාම, උපරිම මට්ටමින් සත්‍යවාදිභාවය සහ අවංකත්වය පවත්වාගෙන ගොස් ඇත. .......... රටේ උපරිම යහපත තකා අතිශය කැපවීමකින් යුතුව රාජකාරි කටයුතු ඉටුකළ අතර, මහජන යහපත මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත."**

ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට හීනවූ ගෞරවයක් දක්වමින් නිර්භීත සහ නොහික්මුණු ලෙසින් කර ඇති ඉහත සඳහන් ප්‍රකාශය මුසාවක් වන බවට පත්කෙරෙන, 22 වන වගඋත්තරකරුගේ දැනීම ඇතුළත වන්නා වූ අවස්ථා බොහෝමයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන සිද්ධිමය කරුනු කාරණා ජාතික හා මහජන අයිතීන් අරබයා ඉදිරිපත් කර සිටීමට 22 වන වගඋත්තරකරුට අනිවාර්යයෙන්ම සිදුවී ඇත.

(b) 22 වන වගඋත්තරකරු 1994/1995 වසරවලදී මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු වශයෙන් සිටියදී ශ්‍රී ලංකා මහා බැංකුව විසින්, මුදල් අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ලෙසට අනුයුක්ත කළ 8 වන වගඋත්තරකරුව දැන හැඳින ගන්න ලැබුණි.

(c) ඉහත තනතුර දරණ අතරතුරදී මෙන්ම 2004/2005 වසරවලදී රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ සභාපති වශයෙන් සිටියදීත්, 22 වන වගඋත්තරකරු රාජ්‍ය තනතුරු නොදැරූ අතරතුරත්, මුදල් අමාත්‍යාංශ ලේකම් වශයෙන් රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස සිටි 8 වන වගඋත්තරකරු සමඟ මුදල් අමාත්‍යාංශයට/මහාභාණ්ඩාගාරයට සම්බන්ධ කාරණා පිළිබඳව කටයුතුවල යෙදී ඇත.

(d) 1995 වසරේ දී ජනාධිපතිතුමා විසින් සංස්ථාපිත කළ රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ, එවකට මහාභාණ්ඩාගාරයේ ලේකම්ට විකල්ප සාමාජිකයකු ලෙස 8 වන වගඋත්තරකරු සාමාජිකයකුවූ අතර, ඉන් අනතුරුව 8 වන වගඋත්තරකරු 1996 අංක.1 දරණ පනත මඟින් සංස්ථාපිත කළ එම කොමිෂන් සභාවේ සාමාජිකයකු විය. 8 වන වගඋත්තරකරු 1997 ජනවාරි සිට 2002 දෙසැම්බර් දක්වා එම කොමිෂන් සභාවේ සභාපති වශයෙන් කටයුතු කළ අතර, 2004 ඉල්ලා අස්වන තෙක් ඔහු එම කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ උපදේශකයකු ලෙස දිගටම නිරත විය.

(e) i) 22 වන වගඋත්තරකරු, එහි 13 වන වගඋත්තරකරු වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක.SC(FR) 158/2007 දරණ නඩුවේ 2009.06.04 වන දින ප්‍රකාශයට පත් කළ නඩු තීන්දුවෙන්, එය සාවද්‍ය, නීතිවිරෝධී සහ අනෛතික ලෙසට ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අවලංගු කළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලිකකරණය ද, 8 වන වගඋත්තරකරු, එවකට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වශයෙන්, මෙහෙයවා ඇත.

> *එකී SC(FR)158/2007 දරණ නඩුවේ 2009.06.04 දින ප්‍රකාශයට පත්කළ නඩු තීන්දුවේ සත්‍ය පිටපතක් **"22RX4"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙසින් අයැද මෙයට යා කොට ඇත.*

ii) 8 වන වගඋත්තරකරු එකී SC(FR)158/2007 දරණ නඩුවේ 7 වන වගඋත්තරකරු වූන අතර, එම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලිකකරණය කිරීම මෙහෙයවීමේ දී, නීත්‍යානුකූල බලයකින් තොරව, 8 වන වගඋත්තරකරු විසින් ක්‍රියාවේ යොදවා ඇති ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම් ද ඔහු විසින් සිදුකර ඇත්තාවූ සාවද්‍ය, නීති විරෝධී සහ අනෛතික ක්‍රියාවන් ද එම නඩුවේ තීන්දුවෙන් සාක්ෂි දරයි.

iii) එම නඩු තීන්දුවෙන් සාක්ෂි දරණ ප්‍රකාර, එකී නඩුවේ 13 වන වගඋත්තරකරු වූත 22 වන වගඋත්තරකරු 2004/2005 වසරවල රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ඔහුගේ ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම් මගින් රජයට සහ මහජනතාවට මහාපරිමාණයේ වංචාවක් සිදුකිරීම වළක්වාලන ලදි.

iv) 22 වන වගඋත්තරකරු 2004/2005 වසරවලදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේ කොමිෂන් සභාවේ සභාපතිව සිටියදී, එවකට ගරු නීතිපති, ජනාධිපති නීතිඥ නැසීගිය කේ.සී.කමලසබේසන් මහතාගේ උපදෙස් මත, නෛතික නඩු කෘතීන් පැවරීම සඳහා 2005 වසරේ දී රජයේ නීතිඥවරයා විසින් සම්බන්ධිත පාර්ශවයන් වෙත දැනුම් දීමක් කර සිටින ලදි. මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් රජය නියෝජනය කරන 8 වන වගඋත්තරකරු විසින් නඩු පැවරීම සඳහා, පැමිණිලි රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නිමාවට පත් කොට, 8 වන වගඋත්තරකරුට යවන ලදි. ඔහුටම හොඳාකාරවම දැනුමක් ඇති හේතූන් මත, 8 වන වගඋත්තරකරු විසින් ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු සිදුකළ නැති අතර, 2005 නොවැම්බර්හිදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති තනතුරෙන් ඉල්ලා අස්විය.

v) එසේ නඩු පැවරීම සඳහා දැනුම් දීමක් කර තිබුණ පාර්ශවයන්ගෙන්, එක් පාර්ශවයක් වන අර්නස්ට් සහ යං සමාගමේ, ප්‍රතිපත්ති උපදේශකයකු වශයෙන් 8 වන වගඋත්තරකරු (SC(FR) 158/2007 දරණ නඩුවේ ඔහු ගොනු කළ දිවුරුම් ප්‍රකාශයේ ඔහු පිළිගෙන ඇති පරිදි) ක්‍රියා කර ඇති බව අනතුරුව 22 වන වගඋත්තරකරුට දැන ගැනීමට ලැබුණ අතර, ඉහත කී නඩු තීන්දුවෙන් ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අර්නස්ට් සහ යං සමාගම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණකවරුන් වශයෙන් ක්‍රියා කිරීම නතර කරන ලදුව, 2003 අප්‍රේල් මස පුද්ගලිකකරණය කරන ලද දිනයේ සිට 2009 ජූනි මස රජය විසින් අයිතිය ලබාගත් දිනය දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලෙසට පසුව අණ කරන ලදි.

vi) රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේ කොමිෂන් සභාවේ සභාපති/මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම්, ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ඡේදයේ ඔහු විසින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ප්‍රතිඥා දීමක් යටතේ කර ඇති ප්‍රකාශය මුසාවක් වන බවට පත් කරයි.

*ඉහත කී ලිපිවල සහ 8 වන වගඋත්තරකරු අර්නස්ට් සහ යං සමාගමේ ප්‍රතිපත්ති උපදේශකවරයා වශයෙන් කටයුතු කිරීමේ සාක්ෂි සාධකවල සත්‍ය පිටපත් ඒකාරාශි ලෙස **"22RX5"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් වශයෙන් මෙයට යාකොට ඇත.*

(f) i) අදාළ ලේඛණ පිරික්සුමට ලක්කරමින් සහ 8 වන වගඋත්තරකරු සහ 22 වන වගඋත්තරකරු ද ඇතුළුව, සම්බන්ධිත පුද්ගලයින්ද විමසමින් විමර්ශනය කිරීමෙන් අනතුරුව 2007 ජනවාරි මස දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ වාර්තාව වෙනත් දේ අතර නිශ්චිත ලෙසින්ම 8 වන වගඋත්තරකරුගේ ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම් පහත දැක්වෙන ලෙසට දෝෂාරෝපනයට ලක් කරමින්, සී/ස ලංකා මරයින් සර්විසස් සමාගම සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලිකකරණය කිරීම දෝෂ දර්ශනයට ලක් කරමින් මෙසේ කියා ඇත.

ii) **පාර්ලිමේන්තුවට රාජ්‍ය ව්‍යවසාය පිළිබඳව කාරක සභාවේ (COPE) වාර්තාව – සී/ස ලංකා මරයින් සර්විසස් සමාගම (LMSL)**

➢ **2002.08.21** දින කැබිනට් මණ්ඩල අනුමැතිය ස්ථිර කිරීමට සහ දැනුම්දීමට පෙර, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේ කොමිෂන් සභාවේ (PERC) සභාපති පී.බී.ජයසුන්දර විසින්,

- සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස් සමඟ ලිපි හුවමාරුවක් මත 2007.07.12 වන දින, LMSL සමාගමේ කොටස් 90% ක් විකිණීමේ "ප්‍රදානය" සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස් වෙත පිරිනමා ඇත.
- 2002.07.10 දින වන විට ඉදිරිපත් කිරීමට 2002.06.25 දින දරණ ලිපියෙන් අවශ්‍ය කළ පරිදි, රු.1,200,000,000/- ක අවම මිල මත 10% ක ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කර සිටි එකම පාර්ශවය වූයේ සී/ස ජොන් කීල්ස් හෝල්ඩිංස් පමණක් යයි වන පදනම මත, "ප්‍රදානය" සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස් වෙත පිරිනමා ඇත. සෙසු ඉල්ලුම්කරුවන් විසින් මෙය "දූෂිත ක්‍රියාවක් ලෙසට චෝදනා කර ඇත.
- සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස් සමඟ ලිපි හුවමාරුවකින් පසුව, 2002.08.02 වන දින, ජොන් කීල්ස් හෝල්ඩිංස් විසින් LMSL කොටස් 90% මිලදී ගැනීමෙන් පසුව, LMSL සමාගමට "ඒකාධිකාරියක්" ප්‍රදානය කිරීමට PERC සභාපති පී.බී.ජයසුන්දර එකඟ වී ඇත. ඊට ඉහත දී LMSL සමාගම සඳහා වසර 8 ක ඒකාධිකාරයක් සඳහා ඉල්ලීමක් කිරීම නිසා සී/ස ශ්‍රී ලංකා ෂිපිං සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලංසුව කාර්මික අගය කිරීමේ කමිටුව (TEC) විසින් ප්‍රතික්ෂේප කර ඇත.
- PERC සභාපති පී.බී.ජයසුන්දර, මහාභාණ්ඩාගාරයේ ලේකම් චරිත රත්වත්තේ, සහ PERC නීති අධ්‍යක්ෂිකා ශාමලි ගුණවර්ධන සම්මුතිගතව ක්‍රියා කරමින්, සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංස් සමඟ 2002.08.20 දින කොටස් විකිණීමේ සහ මිලදී ගැනීමේ ගිවිසුම සහ පොදු භාවිතා පහසුකම් (CUF) ගිවිසුම අත්සන් කර ඇත. CUF ගිවිසුමට කලින් නොතිබූන පහත දැක්වෙන 8.2 වගන්තිය අළුතින් ඇතුළත් විය.

**8.2 කොළඹ වරාය ඇතුලත මෙහෙයවා ප්‍රවාහණය කරනු ලබන සියළු ගුදම් (Bunkes) /නාවික ඉන්ධන, පොදු භාවිතා පහසුකම් (CUF) භාවිතා කරමින් මෙහෙයවන සහ ප්‍රවාහණය කරන බවට ශ්‍රී ලංකා රජය (GOSL) / ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) /ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් සහතික කළ යුතුය.**

- ඉහත ක්‍රියාවන් සිදුකර ඇත්තේ 2002.08.21 දින කැබිනට් මණ්ඩල තීරණ ස්ථිර කිරීමට සහ දැනුම්දීමට පෙරාතුව වන බැවින්, තීතියෙහිලා දෝෂ සහගත, වලංගු රහිත, ශූන්‍ය සහ බලරහිතය.
- ඉහත සඳහන් "ඒකාධිකාර" වගන්තිය ඇතුලත් කිරීම 2002 අංක.3 දරණ ඛණිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ බලය ඉක්මවා යන්නක් වන බවට අභියාචනාධිකරණය නිගමනය කර ඇත.
- 2005.01.19 දින දරණ මෙම ප්‍රදානය කිරීමේ ලේඛණයෙහි රු.1,199,362,500/- ක් LMSL වෙතින් රජයට ලැබී ඇතැයි දැක්වෙතත්, එම ප්‍රදානය කිරීමේ ලේඛණයේ දැක්වෙන ප්‍රකාර, රජය වෙත මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨා මුදලක් ලැබී ඇතිදැයි ස්ථිර කිරීමක් ඉල්ලමින්, PERC සභාපති ඩබ්ලිව්.එම්.බන්දුසේන විසින් භාණ්ඩාගාරයේ ලේකම් පී.බී.ජයසුන්දරට අමතන ලද 2006.03.21 දින දරණ ලිපියට ප්‍රතිචාරය දක්වමින්, ඉඩම පැවරීම වෙනුවෙන්, රජයට කිසිදු මුදලක් ලැබී නැතැයි, 2006.08.18 දින දරණ ලිපියෙන් භාණ්ඩාගාර මෙහෙයවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ස්ථිර කර ඇත.
- එසේ බැවින්, ප්‍රදානය කිරීමේ ලේඛණය "වංචනික ලේඛණයක්" හා මිථ්‍යාවක් වන්නේ ය. ඒ මන්ද යත්, අ.8 රූ.2 පර්.21.44 ක් විශාල බිලුමැන්ඩල් හි රජයේ ඉඩම පැවරීම වෙනුවෙන්, ප්‍රදානය කිරීමේ ලේඛණයේ ලද බවට පිළිගෙන ඇති පරිදි මුදල් ගෙවීමක් රජයට හෝ LMSL විසින් ගෙවාවත් නොමැත. එමනිසා මෙම ප්‍රදානය කිරීමේ ලේඛණය මුණතින්ම, "වංචනික" සහ "මිථ්‍යාවක්" වන තරමටම, මෙම ඉඩමේ නෛතික පැවරීමක් සිදුවිය නොහැක.
- ප්‍රශ්නාත්මක ලෙස "නියම කරගත්තක්" ලෙසට පිළිබිඹු වී දැක්වෙන්නාවූ මෙම ගණුදෙනුව ක්‍රියාවට නංවා ඇත්තේ නොහික්මුණු ලෙස කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව, රජයට පාඩු සහ අනර්තයක් සිදු කෙරෙන දෝෂයන් බෝහොමයක් සහිතව වන අතර, එසේ බැවින් මුල් ආරම්භයේ සිටම එය නීතියෙහිලා දෝෂ සහිත, අවලංගු සහ ශූන්‍ය වන්නේ ය.

## (iii) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ COPE වාර්තාව - සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC)

- මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කාර්මික අගය කිරීමේ කමිටුවක් (TEC) පත්කිරීම, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති නමුත්, ඔහු විසින්ම ටෙන්ඩර් මණ්ඩලයක් පත් කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින්, කැබිනට් මණ්ඩලය විසින් ටෙන්ඩර් මණ්ඩලයක් පත්කළ යුතු බවට තීරණය කර ඇත.
- ලංසු අගය කර බැලීමකින් පසුව, කාර්මික පාර්ශවයන් වූ ING ඉන්ස්ටිටියූෂනල් සහ ගවර්න්මන්ට් එඩ්වයිසරි සර්විසස් BV (Holland ) සහිතව, සී/ස ඩිස්ටිලරීස් සමාගම, සී/ස එයිට්කන් ස්පෙන්ස් සමාගමේ සහ සී/ස එයිට්කන් ස්පේන්ස් ඉන්ෂුයරන්ස් (පුද්ගලික) සමාගම සමන්විත සන්ධානයකට 90% කොටස් විකිණීමට කාර්මික අගය කිරීමේ කමිටුව (TEC) විසින් 2003.03.25 දින නිර්දේශ කර ඇත.
- විකුණුම් සහ මිලදී ගැනීමේ ගිවිසුම සී/ස මිල්ෆඩ් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම සහ 2003.03.28 වන දින සී/ස මිල්ෆර්ඩ් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම සහ ජිබ්‍රෝල්ටාවේ සංස්ථාපිත කළ සමුද්‍රයෙන් දූරස්ථ සමාගමක් වන සී/ස ග්‍රීන්ෆීල්ඩ් පැසිෆික් EM හොල්ඩිංස් සමග 2003.04.11 වන දින අත්සන් කර ඇත. මෙය 2003.03.27 දින කැබිනට් මණ්ඩල අනුමැතිය දුන් අවස්ථාවේ නොපැවතුනි.
- මෙම සමාගම් දෙක ලංසු තැබූ අය නොව අමුත්තන් වේ.
- එම විකිණීම සිදුවී ඇත්තේ විගණනය නොකළ ගිණුම් මත වන අතර, එමගින් මොනයම් අන්දමේ හෝ කොටස් විකිණීමේ ගනුදෙනුවකට එළඹීමට හැකියාවක් නොමැත. ගිණුම් හොර රහසිගතව සහ උවමනාවෙන්ම ගලපා ඇති බව ද පෙනී යයි.
- එකී වංචනික ක්‍රියාදාමයට විගණකවරුන් අර්නස්ට් සහ යං සහ ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් උපදේශකවරු (PWC consultants) කෙළින්ම සම්බන්ධය.

- රජය 100% ක කොටස් දරන්නකුව සිටි අතරතුර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) විගණකවරුන් වූ අර්නස්ට් සහ යං සමාගම, අනෛතික ගැනුම්කරුවන්ට විකිණීම සිදුකළ පසුවත් SLIC විගණකවරුන් ලෙස දිගටම ක්‍රියා කළ අතර රජයට ඔවුන්ගේ වගකීම ඉටුකිරීම සිදු නොකිරීමට, ඔවුන් හා සම්මුතියකට එළඹ ඇත.
- SLIC ගනුදෙනුව මෙහෙය වූ PERC සභාපති හා පසුව මහාභාණ්ඩාගාරයේ ලේකම් වූ පී.බී.ජයසුන්දර, අර්නස්ට් සහ යං සමාගමේ ප්‍රතිපත්ති උපදේශකවරයෙකු වූන අතර, මෙම කාරණයෙහිලා රජයේ අයිතීන් වෙනුවෙන් ක්‍රියා කිරීම ඔහු විසින් අසමත් වී පැහැර හැර ඇත.
- සිද්ධිමය කරුණු කාරණා සහ අවස්ථානුගත හේතූන් මත මෙම ගනුදෙනුව මුල් ආරම්භයේ සිටම ශූන්‍ය සහ බලරහිත සහ නිශ්ඵලදායි වන්නේ ය. බැලූ බැල්මටම වගකිව යුතු නිලධාරීන්ගේ ක්‍රියාදාමයන් රාජ්‍ය දේපල පනතේ සහ අල්ලස් සහ දූෂණ නීතිවල විධිවිධානයන් උල්ලංඝනය කරමින් වන්නේය.

(iv) ඉහත කී COPE වාර්තාවල එළදරව්වී ඇති, PERC සභාපති/මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් 8 වන වගඋත්තරකරුගේ වරියාව සහ ක්‍රියාදාමයන්, ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ඡේදයෙන් ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ඔහු විසින් ප්‍රතිඥා දී කර ඇති ප්‍රකාශය ***මුසාවක් වන බවට පත් කරනු ලැබේ***.

> *2007.01.12 හැන්සාඩ් වාර්තාවේ අංක.358 සිට 364 තීරුවල සහ ප්‍රතිචාරයක් දක්වා නොමැති, 8 වන වගඋත්තරකරුව අමතා ඇති වෙනත් දේ අතර මෙම කාරණය සම්බන්ධයෙන් වූ 22 වන වගඋත්තරකරුගේ 2007.02.20 වන දින දරණ ලිපියේ සත්‍ය පිටපත් ඒකරාශිව "**22RX6**" ලෙස ලකුණු කර මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් වශයෙන් අයැද මෙයට යා කොට ඇත.*

(g) 8 වන වගඋත්තරකරු, එවකට PERC සභාපති වශයෙන්, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන සිල්ලරට බෙදා හැරීමේ හල් (ඉන්ධන පොළවල් 100 ක) ජාලයේ 1/3 ක්, ඒ සඳහාම ලංකා IOC ලෙසින් පිහිටුවාගත්, ඉන්දියානු තෙල් සමාගමට (Indian Oil Company - IOC) ට පුද්ගලීකරණය කිරීමෙහිලා සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවකු ඇත. මෙම සැකසහිත පුද්ගලීකරණයට අදාළ පැහැදිලි සිද්ධිමය කරුණු කාරණා ලුහුඩින් මෙහි පහත ගෙනහැර දක්වා ඇත.

i) ඉන්ධන අංශය විවෘතකරණය කිරීම, එවකට විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් 2002.11.13 වන දින දරණ කැබිනට් සංදේශය මගින් මූල පිරුවේ ය.

ii) තරඟකාරී ඉල්ලීම කිසිවක් විනිවිද ලෙස නොකැඳවා, ප්‍රශ්නාත්මක ලෙසින් ඉන්දියානු තෙල් සමාගම, එයට පමණක්ම සීමිත වන ලෙස තෝරාගෙන ඇත.

iii) එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාවරයා විසින් 2003.10.07 වන දින දරණ කැබිනට් සංදේශය සහ එදිනම කැබිනට් මණ්ඩලයට යැවූ සටහනක් මගින්, ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) පුද්ගලීකකරණය කිරීම අනෝන්‍යාව, IOC සමඟ වන ගනුදෙනුව පිළිබඳව පැහැදිලි කර ඇත.

iv) ඉන්ධන ස්ථාන 100 සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ඉන්ධන පොළවල් සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 75 ක් ද සහ පොදු භාවිතා පහසුකම්න් 1/3 ක කොටසක් ද LIOC විසින් ගෙවිය යුතුව තිබුණි.

v) තෝරා ගැනීම සඳහා LIOC වෙත මනාපයක් දී තිබුණ ඉන්ධන පොළවල් 100, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉතාමත්ම ලාභදායී ඒවා බව කියනු ලැබේ.

vi) ඉන්ධන ස්ථාන වැඩිදියුණුව සඳහා LIOC විසින් ආසන්න ලෙස රුපියල් මිලියන 2 සිට 3 දක්වා වන ආයෝජනයක් ද කැප කර ඇත.

vii) එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2003.10.08 වන දින දරණ වැඩිදුර කැබිනට් සංදේශයක් මත 2003.10.10 වන දින එවකට විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් කර තිබූ නිරීක්ෂණයන් ප්‍රකාර, ඉහත කී මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව ගෙවිය යුත්තේ විදේශීය මුදල මගින් මිස ස්වදේශීය බැංකු මගින් ගනු ලබන මුදල් මගින් නොවන බවට නියම කර තිබුණි.

viii) කෙසේ වෙතත්, එම නියමය උල්ලංඝනය කරමින් IOC විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 40 ක් පමණක් විදේශීය මුදල්වලින් ආයෝජනය කර ඇති අතර, ඉතිරි එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ආයෝජනය කර ඇත්තේ දේශීය බැංකු මගිනි.

ix) ප්‍රධාන තක්සේරුකරුගෙන් කිසිදු අගය තක්සේරුවකින් තොරව, අර්නස්ට් සහ යං සමාගම විසින් පොදු භාවිතා පහසුකමේ 1/3 කොටසේ වටිනාකම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 40 කින් සහ ඉන්ධන පොළවල් 100 සඳහා අගය වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 31 කින් ද සමන්විත එක්සත් ජනපද ඩොලර් මිලියන 71 ක අගය තක්සේරුවක් කර ඇත.

x) විනිවිද වූ තරඟකාරීව ලංසු තැබීමේ ක්‍රියාවලියක් මත, හරියාකාරව වෙළඳ අගය ස්ථාපිත කිරීම සඳහා කිසිදු තරඟකාරී ලංසු තැබීමක් නොකැඳවා, එක්සත් ජනපද ඩොලර් මිලියන 75 ක් ගෙවීමට IOC වෙත ඉඩහැර ඇත්තේ, අර්නස්ට් සහ යං සමාගමේ එවැනි අගය තක්සේරුව පදනම කරගෙනය.

xi) ඊට අමතරව, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මෙහෙය වූ ඉන්ධන, ස්ථානවලට පිටස්තර වූ වෙළඳුන්ට හිමි සහ වෙළඳුන් විසින් ක්‍රියා මෙහෙයවූ ඉන්ධන පොළවල් අත්පත් කර ගැනීමේ අයිතිය LIOC වෙත දෙනු පිණිස, එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ක් තෙක් උපරිමයකට අර්නස්ට් සහ යං සමාගම විසින් එකතුකළ "අධිප්‍රසාදයක්" වශයෙන් තක්සේරු කර ඇත.

xii) කෙසේ වුවත් රජයට ඒ සඳහා කිසිදු ප්‍රතිජ්ඨාවක් ලැබීමකින් තොරව, 2003.12.30 වන දින දරණ විකුණුම් සහ මිළදී ගැනීමේ ගිවිසුමේ, LIOC වෙත ප්‍රමාණාත්මක ලෙස එවැනි අයිතියක් පිරිනමා ඇත.

xiii) මෙම විදේශීය මුදලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 75 ක ආයෝජනයක් ලැබෙන්නේ යැයි යන පදනම මත, එවකට PERC ආයතනයේ සභාපති 8 වන වගඋත්තරකරු විසින් සකසන ලද්දාවූ, සැකකටයුතු "මිළ නියම කිරීමේ විධික්‍රමයක් " මත, රජය විසින් LIOC වෙත සහනාධාරයක්දීම විකුණුම් සහ මිළදී ගැනීමේ ගිවිසුමෙහි සළසා ඇත.

xiv) "මිළ නියම කිරීමේ විධික්‍රමය" සකසන ලද්දේ අර්නස්ට් සහ යං සමාගම විසින් යැයි 8 වන විත්තිකරු විසින් කියා සිටිනු ලදුව, අර්නස්ට් සහ යං සමාගමේ කරුණු පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින ලදුව, ඔවුන් සහභාගිවූ අවස්ථාවේදී එවකටත් එය එලෙසින් තිබුන බව ඔවුන් දැනුම් දී ඇති අතර, PERC හි එවකට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අර්නස්ට් සහ යං සමාගම වෙත යවන ලද 2005.08.24 දිනැති ලිපියෙන් එම සිද්ධාන්තය සනාථ කර ඇත.

xv) ආනුෂාංගිකව ලංකා ඛණිජ තෙල් සංස්ථාව වෙතින් අත්පත් කරගනු ලැබූ ඉන්ධන පොළවල් 100 ට අමතරව, LIOC විසින් අත්පත් කරගෙන තිබූ වෙළඳුන්ට හිමි සහ වෙළඳුන් මෙහෙයවූ 70 කට ආසන්නවූ ඉන්ධන පොළවල් ආවරණය වීමද ඇතුළත්ව, LIOC වෙත අසාධාරණීය පොහොසත් වීමක් සැලසුන රජයෙන් පිරිනැමුන සහනාධාරයන් සඳහා ඉදිරිපත් කෙරුන ඉල්ලීම් 2006 අප්‍රේල් වන විට රුපියල් මිලියන 9620 දක්වා උපචිතව තිබුනි.

xvi) අනුමාන පදනමක් මත ඇත්තවශයෙන්ම දරණ ලද වියදම්, "මිල නියම කිරීමේ විධික්‍රමයේ" ඒ සඳහා සලසා දී තිබුන සංයෝජනයන්ට වඩා අඩුවීමේ පදනම මත, ගරු නීතිපතිතුමාගෙන් සහ පෞද්ගලික නීතිඥවරුන්ගෙන් ලබා ගත් මත ප්‍රකාශයන් මත, 22 වන වගඋත්තරකරු විසින් එකී සහනාධාර සඳහා ඉදිරිපත් කළ ඉල්ලීම් ආරාවුලට ලක්කර සිටින ලදී.

xvii) ඉන් අනතුරුව, කිසිදු විනිවිදභාවයකින් තොරව, සහනාධාරයෙන් කොටමක් අඩුකරමින් සහ 22 වන වගඋත්තරකරු තරයේ විශ්වාස කරන අන්දමට, එකඟවූ ඉතිරි මුදල සඳහා රජයේ ඇපකර සලසා දෙමින් කලින් මහා භාණ්ඩාගාරයේ ලේකම් LIOC සමඟ එකඟතාවයකට එළඹී ඇත. එහි නියමයන් දැන ගන්නට නැත.

xviii) ඊට අතිරේකව, එහි ප්‍රධාන ව්‍යාපාරයට අමතරව, එවැනි ව්‍යාපාරයන්හි නිරත සෙසු අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට තුඩු දෙන පරිදි ස්වයංක්‍රීය කාර් සේදීම, කාර් සර්විස් කිරීම, බහු අංශ වෙළඳ සැල්, අන්තර්ජාල හල්, මුදල් ආපසු ලබා ගැනීමේ (ATM) හල්, ආපනශාලා වැනි වූ වෙනත් ව්‍යාපාර සඳහා 2006 දෙසැම්බර් මසදී, LIOC වෙත ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

xix) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛණිජ තෙල් නිපැයුම් බෙදා හැරීමේ (ඉන්ධන පොළවල් 100 කට අධික) සිල්ලර පද්ධතියේ ඉතිරි 1/3 ක කොටස පුද්ගලීකරණය සඳහා චීන සමාගමක් වන SINOPEC සමඟ සම්ප්‍රේෂණ ක්‍රියාවලියක යෙදී සිටියදී, චීන සමාගමක් තරඟකාරීත්වයක් ඇති කරනවා මෙන්ම ඛණිජ තෙල් නිපැයුම් සඳහා මෙරටට වෙනත් ප්‍රවාහයක්, ඒනම් චීනය, උදා කිරීම ගෙන දීමේ සිදුවීමක් තිබුන අතරතුර, 8 වන වගඋත්තරකරු, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන්, PERC ආයතනයේ කිසිදු අනුදැනුමකින් තොරව, මෙම 2 වන 1/3 ක කොටස නවත් ඉන්දියානු රජයේ සමාගමක් වන භාරත් පෙට්‍රෝලියම් සමාගමට භාරදීමට ඇරයුම් කර සිටින ලද අතර ( එනම් එමගින් IOC භාරත් යන සමාගම් දෙකම ඉන්දියානු රජයකට අයිතිවීමෙන් ඒකාධිකාරයක් හට ගැනීම සිදුවනවා ඇත.) ඉහත සඳහන් සැක සහිත තිල සහනාධාර විධි ක්‍රමය පිළිබඳ ප්‍රශ්ණය ඉහත කී භාරත් පෙට්‍රෝලියම් සමාගමට 22 වන වගඋත්තරකරු විසින් නගා සිටුවන ලදුව භාරත් පෙට්‍රෝලියම් සමාගම පසු බැස්සේය.

xx) PERC ආයතනයේ සභාපති/මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියාදාමය සහ ක්‍රියාකාරකම්, ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 ජේදයේ ප්‍රතිඥාවක් යටතේ ප්‍රකාශ කර ඇත්තාවූ දැ <u>**මුසාවක් වන බවට දෙස් දෙයි.**</u>

> *ඉහත සඳහන් අදාළ ලේඛණවල සත්‍ය පිටපත් "22RX7" ලෙස ඒකරාශීව ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙසින් මෙයට යාකොට ඇත.*

(h) i) මෙරටේ පුද්ගලීකරණයන් ක්‍රියාත්මක කර ඇති නොසැලකිලිමත් සහ සැක කටයුතු ආකාරයේ හේතුවෙන් පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය ගැන මහජනයාගේ විශ්වාසය සෝදාපාලු වී ගොස් ඇති අතර පුද්ගලික අංශයේ සාධාරණීය ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිව්‍යුහය කිරීම සහ ඒවා පුද්ගලික අංශයේ සේවකයන් ප්‍රතික්ෂේප කර සිටිණි.

ii) ඉහත 14 (d) ජේදයේ සඳහන් කර ඇති පරිදි 1995 වසරින් පසුව කරන ලද පුද්ගලික කරණයන්ට 8 වන වගඋත්තරකරු ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇති අතර ඒවාට ප්‍රධාන පාර්ශවකරුවකු වී ඇත.

iii) ක්‍රියාවට නගා ඇති එම පුද්ගලික කරණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් පශ්චාත් පුද්ගලික කරන ප්‍රශ්ණ සහ පශ්චාත් පුද්ගලීකරණ තඩු පැවරුම් ගණනාවක්ම හට ගැනුණි. 2004/2005 වසර වලදී 22 වගඋත්තරකරු PERC ආයතනයේ සභාපති වශයෙන්, මෙම ප්‍රශ්ණ සහ තඩු හබ පිළිබඳව, PERC ආයතනයේ වෙනම අධීක්ෂණ සහ ඇගයුම් මණ්ඩලයක් මගින් විමධ්‍යගතව සහ ක්‍රමාණුකූලව කටයුතු කිරීමට, ඒවා හඳුනා ගැනීමට කටයුතු සලසන ලදී.

> *මෙම පශ්චාත් පුද්ගලීකරණ තඩු හබ පිළිබඳ විස්තර දැක්වෙන PERC ආයතනයේ 2004 වාර්ෂික වාර්තාවේ 5, 6, 7 දරණ පිටුවල සත්‍ය පිටපත් ඒකරාශීව "22RX8" ලෙස ඒකරාශීව ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙසින් මෙයට යාකොට ඇත.*

iv) පශ්චාත් පුද්ගලීකරණ ප්‍රශ්ණ සහ පශ්චාත් පුද්ගලික කරණ තඩු හබ සම්භාරයක්ම හඳුන්වා දැක්වෙන ඉහත කී පිටුවලින් වෙනත් ඒවා අතර 8 වන වගඋත්තරකරු විසින් මෙහෙයවා ඇති නොසැලකිලිමත් සහ සැකකටයුතු පුද්ගලික කරණ ක්‍රියාවලියන් පිළිබඳව පරිමාධික ලෙසින් කියාපායි.

v) එයින් වඩාත්ම ලාභදායි වූ පළමු වැව්ලි සමාගම් 6 සැක කටයුතු විධික්‍රමයක් මත හුදෙක් රුපියල් මිලියන 612 ක් පමණක් වූ මුළු මිල ගණනකට (එකක් රුපියල් මිලියන 102 බැගින්) පුද්ගලික අංශයේ වැවිලි කළමණාකරණ සමාගම්වලට පුද්ගලික ගිවිසුම්ගතව ප්‍රශ්නාත්මකව ලෙස විකිණූ, වැවිලි සමාගම් 20ක පුද්ගලික කරණයෙන් රජයට සිදුවුන කැපීපෙනෙන සුළු පාඩුවක් සිදුවුන අතර විනිවිද විවෘත තරගකාරී ලංසු තැබීමක් සිදුවූයේ නම් එහි ප්‍රතිඵලය වන්නේ රුපියල් මිලියන 4000 ට - 6000 කට ආසන්න වන විකුණුම් මුදලක් ලැබීමය. රුපියල් මිලියන 612 ක ගැණුම් මුදල සඳහා 2003 දෙසැම්බර්/2004 මාර්තු වන විට වැවිලි පරිපාලන සමාගම් විසින් කළමණාකාර ඒජන්ත ගාස්තුව වශයෙන් රුපියල් මිලියන 1865/- ක මුදලක් උපයාගෙන ඇති අතර ඊට අමතරව ලාභාංශ වශයෙන් රුපියල් මිලියන 460 ක්, කොමිෂන් ගාස්තු සහ අතිකුත් සැඟවුණු ප්‍රතිලාභ ආදිය ද උපයා ඇත.

> *"ජනාධිපතිතුමා වෙත යවන ලද 22 වන වගඋත්තරකරුගේ 2005.06.06 සහ 2005.06.13 දිනයන් දරණ සංදේශ, ඇමුණුම් රහිතව ඒකරාශීව* ***22RX9"*** *ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද මෙයට යාකොට ඇත.*

vi) වැවිලි සමාගම්වල වර්තමාන තත්වයන් හේතුකොට ගෙන මෙම අංශයේ අර්බුදකාරී තත්වය පරික්ෂා කිරීම සඳහා කමිටු පත්කිරීමට ජනාධිපතිතුමාට සිදුව ඇත.

vii) I රජයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වශයෙන් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයෙකු වූ, එනම් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් 8 වන වගඋත්තරකරු ප්‍රශ්නාත්මක ලෙස සහ සැක කටයුතු අන්දමින් ක්‍රියා කල ආකාරයේ වැඩිදුර නිදසුනක් වශයෙන් තුල්හිරිය සහ මත්තේගම, පෙහෙකම්හල් නැවත ස්ථාපිත කිරීම සඳහා PERC ආයතනය විසින් විනිවිද සහ තරගකාරී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම වැලැක්වීමට ඔහු බලහත්කාරී ලෙස මැදිහත්වීම ගෙන හැර පායි.

II ප්‍රශ්නාත්මක කොටස් ප්‍රාග්ධනය පිළිවෙලින් රු.20/- ක් සහ රු.300/- ක් පමණක් සතු මොනයම් ආකාරයකවත් යම් විශ්වාසනීය සහතිකයක් නොතිබුන, පුද්ගලික සමාගම් දෙකක් සමග ප්‍රශනාත්මක ලෙස හොරරහසිගතව පුද්ගලික සම්මුතියකට එළඹී මේ ක්‍රියාවලියක් මගින්, මෙම රෙදි කම්හල්

දෙක පුනුරුත්ථාපනය කිරීම ඔහුගේ විෂය පථය යටතේ වූත, මුදල් අමාත්‍යාංශය මගින් මෙහෙයවීමට ගැනීමට 8 වන වගඋත්තරකරු මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් ජනාධිපතිතුමා එත්තු ගැන්වීමට මැදිහත්වී ය.

*හටගත් සිද්ධීන්වල නින්දිත ස්වභාවය එළිදරව් වන 22 වන වගඋත්තරකරුගේ 2005.03.13 දිනැති සටහනේ සහ ඇමුණුම් සහිතව 2005.03.28 දිනැති සංදේශයෙන්, කැබිනට් මණ්ඩලයට යැවූ 2005.01.06 දින දරණ කෙටුම්පතේ ද සත්‍ය පිටපත් ඒකරාශී ලෙස "22RX10" ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවත්තක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

viii) අනතුරුව වටිනා තුල්හිරිය රෙදි කම්හල් සංකීර්ණය MAS හොල්ඩිංස් සමාගමට භාරදී ඇති බවත්, <u>එළිදරව් නොකළ පාඩු සහිතව</u> මත්තේගම රෙදි කම්හල වත්කම් විකිණීමක් මාර්ගයෙන් මහජන බැංකුව විසින් වෙන්දේසි කළ බවත් 22 වන වගඋත්තරකරු විශ්වාස කරයි. ඔබ උතුමණන්ලාගේ අධිකරණ අණ ප්‍රකාර රාජ්‍ය තිළ තනතුරුවලින් 8 වන වගඋත්තරකරුගේ ඉවත්වූනු සැනින්ම 8 වන වගඋත්තරකරුගේ පුද්ගලික ලේකම් MAS හෝල්ඩිංස් සමාගමේ වැඩකරන බව 22 වන වගඋත්තරකරුට දැන ගන්නට සැලසී ඇත.

ix) 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරීකම්, ඔහු විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ඡේදයේ ප්‍රතිඥාවක් මත කියා ඇති දැ <u>මුසාවක් වන බවට දෙස් දෙයි.</u>

(i) (i) විගණකාධිපති විසින් 2006 ජූලි මසදී හෝ එයට ආසන්නයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් 154(6) ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර, "රජයේ බදු ආදායම කළමණාකරණය පිළිබඳව විශේෂ ව්‍යාපෘති විගණනය" යන ශිර්ෂයෙන් යුතු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

(ii) අදාළ කාලවලදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මහා භාණ්ඩාගාරයේ ලේකම් වූත 8 වන වගඋත්තරකරු සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින් එකී වාර්තාවේ කාරක සාරාංශයෙහි වෙනත් දේ අතර, මෙසේ ප්‍රකාශ කර තිබුණි.

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන් ප්‍රකාර අදාළ අමාත්‍යාංශයේ ලේකම්රයා මත පැවරෙන්නාවූ වගකීම් සහ ගණකාධිකරණ නිළධාරීන් වශයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානී මත මුදල් රෙගුලාසි මගින් පැවරෙන්නාවූ වගකීම් නිසියාකාරව ඉටුකර නැත.*

*විගණන විසින් උග්‍ර ප්‍රමාද දෝෂයන් පිළිබඳව අදාල ආයතනයන්ට දැනුම් දීමක් කර සිටීමෙන් පසුවද වුවත්, ගතයුතු අවශ්‍ය ක්ෂණික පියවර නොගෙන, ඒ වෙනුවට ප්‍රශ්නාත්මක ප්‍රතිචාරයන් දැක්වීම, ගැටළු ඉස්මතුකරයි.*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(2) ව්‍යවස්ථාවේ විධිවිධානයන් ක්‍රියාවෙහි යෙදවීමෙහිලා මෙම වගකීමේ ක්ෂේත්‍රයේ සමස්ථ වගකීම පැවරෙන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මතය.*

*අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ස්වකීය අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තුද වෙනත් ආයතනද ස්වකීය අමාත්‍යාවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙය විය යුතුය යන ව්‍යවස්ථාපිත විධිවිධානය අනිකුත් සියළුම විධිවිධාන අභිබවා යයි.*

*ඒ හැරුණු විට, ප්‍රධාන ගණකාධිකරණ නිළධාරියා වන අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සහ මූල්‍ය පාලනය සහ රජයේ පරිපාලනමය කටයුතු පවත්වාගෙන යෑම සිය ප්‍රමුඛ වගකීම වන මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන්ද ඔහුට විශාල වගකීමක් සහ රාජකාරියක් මුදල් රෙගුලාසිවල නියමයන් ප්‍රකාර පැවරේ."*

(iii) රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (COPE) විසින් පාර්ලිමේන්තුට 2005 වසරේ ඉදිරිපත් කළ වාර්තාවේ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳව සඳහන් කරමින්, වෙනත් දේ අතර මෙසේ වාර්තා කර තිබුණි.

*"විගණකාධිපතිවරයා සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව පහත දැක්වෙන කරුණු ඔවුන්ගේ වාර්තාවන් හි ඉස්මතු කර පෙන්වා දී ඇත.*

* *අපනයන උත්පාදන රටට ප්‍රේෂණය කිරීම සහ රටට විදේශ විනිමය පාඩුව බැංකුව විසින් අධීක්ෂණය නොකළ නිසා, අපනයන ඉපයුම් මෙම සම්ප්‍රේක්ෂණයන් කිරීම පහත වැටීම"*

*"ඔබ කමිටුව විසින් අවසාන වශයෙන් මෙසේ නිර්දේශ කර සිටී.*

* *ශ්‍රී ලංකාවට අපනයන උත්පාදන නොඑවීම ගැන විමර්ශන පවත්වා, විදේශීය සම්පත් දියවී යෑම පිටුදැකීමට උචිතාකාරව ප්‍රතිකාර්මික ක්‍රියා කටයුතු කරන්න."*

(iv) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියාවරියාව සහ ක්‍රියාකාරීකම්, ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ඡේදය මගින් ඔහු විසින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ප්‍රතිඥාවක් යටතේ කර ඇති ප්‍රකාශය <u>මුසාවක් වන බවට දෙස් දෙයි.</u>

*"2006 ජුලි මසදී විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ එකී වාර්තාවේ කාරක සාරාංශයේ හා ඉහත කාරණයන් සම්බන්ධයෙන් වූත සහ මේ දක්වාම ප්‍රතිචාරයක් නොදක්වා ඇති **22** වන වගඋත්තරකරු විසින් **8** වන වගඋත්තරකරුට යවන ලද **2004.08.24** වන දින දරණ ලිපියේ සත්‍ය පිටපත් ඒකාරාශි ලෙස **"22RX11`** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවත්තක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

(j) (i) එය නීතියේ ආධිපත්‍යයට එදිරිවාදී වන බවට සහ **රජයට** විස්තීරණ පාඩු සිදුකරමින් මහජන ආදායම **වංචා** කර තිබෙන බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක. (SC Reference) අංක 1/2004 නඩුවේ විනිශ්චිතව ප්‍රකාශ කරන ලද සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක.SC (SD) 26/2004 හි නිශ්චයය කරනු ලැබූ අගතිගාමී 2003 බදු සමා ගැන නඩුමගට බසින ලදුව, ආනුෂාංගිකව, රජයේ වෙනස් වීමක් සමගම අගතිගාමී එම පනත 2004 අංක.10 දරණ පනත මගින් අහෝසි කරන්නට යෙදුනි.

(ii) **ඒ අනුව රුපියල් මිළියන 200,000 කට ආසන්න වී යැයි සැලකුන රජයට අයවිය යුතු ආදායම කපාහැරීම 22 වන වගඋත්තරකරු විසින් ඔහුගේ ක්‍රියාදාමයයන් මගින් වලක්වාලමින්, නීතියේ ආධිපත්‍යයට එදිරිවාදී වූ ක්ෂමාවත් වලක්වාලන ලදි.**

(iii) එවකට දේශිය ආදායම් කොමසාරිස්වරයා විසින් එකී 2004 අංක.10 දරණ පනත ක්‍රියාවෙහි යොදා නොමැති බවට සොයා දැන ගන්නා ලදුව, 22 වන වගඋත්තරකරු, PERC හි සභාපති වශයෙන්, 2005.06.10 දින දරණ ලිපිය මගින් එම ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා අමතමින්, VAT වංචාව පිළිබඳව කාරණය විමර්ශනය කොට නීතිය යටතේ ගැනීමට තුඩුදුන් පියවර ගැනීම සඳහා, 22 වන වගඋත්තරකරු සහය දෙමින් සිටි ජනාධිපති විමර්ශන ඒකකයට යොමු කරන ලෙසට, පහත උපුටා දක්වා ඇති පරිදි, යෝජනා කරන සිටින ලද අතර, එය 2005.06.12 වන දින දරණ සටහනකින් යුතුව, එවකට PERC ආයතනය ඔහුගේ විෂය පාඨය යටතේ පැවති, ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

**වංචනිකව සිදු කළ VAT සහ GST බදු ආපසු ගෙවීම්**

***විගණකාධිපතිවරයා විසින් වාර්තා කර තිබෙන VAT සහ GST බදු ආපසු ගෙවීමට අනොත්තව සිදුකර ඇති වංචාව සම්බන්ධයෙන්, විමර්ශණය කොට නීතිය යටතේ ගැනීමට තුඩුදී ඇති ක්‍රියාවන් ගැනීම සඳහා ජනාධිපති විමර්ශණ ඒකකයට මෙම කාරණය යොමු කරන මෙන් යෝජනා කරන ලදි.***

(iii) ඉහත කී ලිපි, PERC ආයතනයේ සාමාජිකයකු වශයෙන් 8 වන වගඋත්තරකරුට යවන ලදුව, ඔහු විසින් 2005.07.01 වන දින දරණ ලිපියෙන් එකී ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාගෙන් කරුණු පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින ලද අතර, ඉන් අනතුරුව, 2007.07.09 වන දින විශ්‍රාම ගැනීමට නියමිතව තිබුණ එම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට සේවා කාලය දීර්ඝ කරදීමට අපොහොසත්වන ලදුව, එම 2005.07.01 වන දින දරණ ලිපිය නොතකා හැර, ප්‍රශ්නාත්මක ලෙසට ඔහුව, මුදල් අමාත්‍යාංශයට උපදෙස් දෙන්නෙකු ලෙසට පත් කරන ලදි.

(iv) **එම ඒකකය විසින් විමර්ශන කිරීමෙන් අනතුරුව, කාරණය අපරාධ විමර්ශණ දෙපාර්තමේන්තුවට යොමු කිරීමට තිබුනේ වී නමුත්, VAT වංචාව පිළිබඳව කාරණය ජනාධිපති විමර්ශන ඒකකයට යොමු කරන ලෙසට 2005.06.10 වන දින කරන ලද 22 වන වගඋත්තරකරුගේ ඉහත කී යෝජනාව නොසලකා හරිමින් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් 8 වන වගඋත්තරකරුට එම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යවා ඇති 2005.06.23 වන දින දරණ ලිපියෙන් සාක්ෂි දරණ ප්‍රකාර, එම දේශීය ආදායම් බදු කොමසාරිස්වරයා 8 වන වගඋත්තරකරුගේ එකඟතාවය/වංක සහයෝගිත්වය ඇතිව, හුදෙක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේම, "අභ්‍යන්තර කමිටුවක්" පත් කර ඇත.**

(v) 2002/03 සහ 2003/04 වසරවලදී VAT බදු ආපසු ගෙවීම්වල ඇඩි වැඩිවීම පිළිඹිබුකර දක්වමින් 2002 සිට 2004 වසරවලදී සිදුවී ඇති VAT වංචාව, රාජ්‍ය ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (PAC) විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ එහි අතුරු වාර්තාවේ ඉස්මතුකර පෙන්වා ඇත. 8 වන වගඋත්තරකරු විසින් ප්‍රශ්නාත්මක ලෙස, ඉහත කී පරිදි, 22 වන වගඋත්තරකරු විසින් යෝජනා කර තිබුණ පරිදි, මේ සම්බන්ධයෙන් කාලෝචිතව ගැනීමට තුඩුදුන් අපරාධාත්මක ක්‍රියා මාර්ගයන් ගැනීමට හෝ එසේ ගැනීම සිදුකිරීමට ක්‍රියා කර නැත. මෙයින් පැන නගින ප්‍රශ්නය වන්නේ, දැන් අවස්ථාගතවී ඇතැයි වාර්තා වී ඇති VAT වංචාවට අදාල ලේඛණ හා වාර්තා විනාශ කර දැමීමට, එවැනි ප්‍රශ්නාත්මක ක්‍රියාවට අවස්ථාව සලසා දුන්නේදැයි ය.

(vi) 8 වන වගඋත්තරකරුගේ ඉහතකී ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම්, ඔහු විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 වන ජේදයේ ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ ප්‍රතිඥාවක් යටතේ කර ඇති ප්‍රකාශය ***මුසාවක් වන බවට දෙස් දෙයි.***

*2005.06.10 දින දරණ ඉහත කී සටහනේ, 2005.06.10, 2005.07.01 සහ 2008.06.04 දිනයන් දරණ ලිපිවල, 2008.03.18 දින දරණ හැන්සාඩ් වාර්තාවේ 2861 සහ 2862 තීරුවල සහ 2007 නොවැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ වාර්තාවේ කාරක සාරාංශයේ සත්‍ය පිටපත් ඒකාරාශි ලෙස "**22RX12**' ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

(k) (i) රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ (PAC) සහ COPE ආයතනයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් කලින් විගණකාධිපතිවරයා විසින්, 2007 අගෝස්තුවේ හෝ එයට ආසන්නයේ දී, "රාජ්‍ය මූල්‍යය මත පාර්ලිමේන්තු පාලනය ශක්තිමත් කිරීම" – යනුවෙන් ශීර්ෂගත කොට ඉදිරිපත් කළ වාර්තා කෙටුම්පතෙන් පහත දැක්වෙන උද්ධෘත උපුටා දක්වනු ලැබේ.

*"එම පනතේ 6 වන වගන්තිය යටතේ දී ඇති බලයේ නියමයන් ප්‍රකාර, රුපියල් මිලියන 166 ද අතුළුව, 2005 අංක.39 දරණ විසර්ජන පනතේ 5 වන වගන්තියේ විධිවිධානයන්වල නියමයන් ප්‍රකාර, නිළධාරීන්ගේ අභිමතය පරිද,' අයවැය රුපියල් මිලියන 220.2 කින් ප්‍රතිශෝධනය කිරීම, 148 ව්‍යවස්ථාව මගින් පවරා ඇති රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලන බලයෙන් කොටසක් අතහැර දැමීමකට සමානවේ ද යන ප්‍රශ්නය මතු කරයි. "*

*2006 වසරේ වැය සඳහා මුලිකව අනුමත කළ රුපියල් බිලියන 609 සහ නියම වැය ලෙස දක්වා ඇති රුපියල් බිලියන 1,072.8 සමඟ සංසන්දනය කළ කල්හි, එම රුපියල් බිලියන 220.2 ක ගණන ඉතා අධික අනුපාතයක් නියෝජනය කරයි.*

*නිළධාරීන්ගේ අභිමතයට ඉඩහැර ඇති මෙම පිළිවෙත සලසා ඇත්තේ පාර්ලිමේන්තුවේ මෙන්ම අමාත්‍ය මණ්ඩලයේ හෝ අමාත්‍යවරයාගේ පවා අනුමැතිය හෝ අවසරය අවශ්‍ය නොවන ආකාරට වන බැවින් මෙය වඩාත් බරපතල බවට පත්වේ.*

*2003 අංක.3 දරණ රාජ්‍ය මූල්‍ය කළමණාකරණ (වගකීම්) පනතේ 13, 14 සහ 15 වගන්තිවල අනුමත කළ අයවැය සහ නියම අයවැය පිළිබඳව ප්‍රකාශ ක්‍රියාවට නගා ඒ මත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විධිවිධාන සලසා ඇතත්, 2006 සඳහා මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තාව, සංසන්දනයකට පැහැදිලි හා ප්‍රමාණවත් ලෙස පහසුකමක් සලසා නැත. එමනිසා යථා තත්වය පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට සලසා ඇති ඉඩ ප්‍රස්ථාව අතහැර දමා ඇත."*

*විසර්ජන පනත අනුව, 2006 වසර සඳහා අනුමත කළ රුපියල් බිලියන 609 ක මුළු වැයෙන්, සියයට 10 ක් ඉක්මවා යන රුපියල් බිලියන 62.2 කට ගණනය වන ප්‍රතිපාදනය 801 වැය ශීර්ෂයට ලබා දී ඇත. 2006 වසරේ 801 වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදනය රුපියල් බිලියන 109 සිට රුපියල් බිලියන 171.2 දක්වා වැඩි කිරීම පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත.*

*අනුමත අයවැයට එදිරි ලෙස පාර්ලිමේන්තුවේ කිසිදු අනුදැනුමකින් හෝ අනුමැතියකින් තොරව, ඔවුන්ගේ අභිමතය පරිදි එකී පනතේ **5 (1)** සහ **6** වගන්තිත් හි නියමයන් ප්‍රකාර ප්‍රදානය කර ඇති අවස්ථාව මගින්, **2006** වසරේ දී මහජන මුදල් වලින් රුපියල් බිලියන **220.2** ක් රාජ්‍ය නිලධාරි පෙලැන්තිය විසින් වැය කොට ඇත"*

*පාර්ලිමේන්තු ගිණුම් අනුකාරක සභාව (PAC) සහ COPE ආයතනය වෙත ඉහත කී වාර්තාවේ හඳුන්වාදීම අඩංගු පිටුවල සත්‍ය පිටපත් **"22RX13'** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

(ii) පාර්ලිමේන්තුවට සම්ප්‍රේක්ෂණය කරන ලද 2007 විසර්ජන ගිණුම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක. SC (SD) 7/2007 දරණ නඩුවේ නිශ්චයයෙහි, ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ස්ථිර කර ඇති ප්‍රකාර, දැන ගැනීමේ ව්‍යවස්ථාපිත අයිතියක් ඇති පාර්ලිමේන්තුවට සහ මහජනයාට, විස්තර නොදන්, එවැනි අභිමතානුකූල ගෙවීම සඳහා වගකිවයුතු වන්නේ, ඉහත කී PAC සහ COPE වෙතට වූන වාර්තාවේ සඳහන් කාල පරිච්ඡේදයේ මහා භාණ්ඩාගාරයේ ලේකම් වූ 8 වන වගඋත්තරකරු ය.

(iii) යෝග්‍ය සහ නිසි පරිදි කළයුතු අනාවරණයකින් තොරව, මහජන මුදල් විය පැහැදම් කිරීම සඳහා පිරික්සීමකින් තොර අභිමතාර්තානුකූල බලය මගින් දේශපාලනඥයන් පවා ඔහුට ගැති වී සිටීමට සහ/හෝ බැඳීමකට යටත්ව සිමට සිදුවන 8 වන වගඋත්තරකරුට අතිසි බලයක් ලැබී තිබුණි. එවැනි පරිචයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නකි.

(iv) 2008 විසර්ජන ගිණුම 22 වන වගඋත්තරකරු විසින් අභියෝගයට ලක්කර සිටින ලදුව, පාර්ලිමේන්තුවට සම්ප්‍රේෂණය කරන ලද 2008 SC (SD) අංක. 3 දරණ නඩුවේ නිශ්චයයෙහි, ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් වෙනත් දේ අතර, මෙසේ ප්‍රකාශ කර තිබුණි.

***"2008 නොවැම්බර් 06 වන දින (අයවැය දිනයේදී) පාර්ලිමේන්තුවට රාජ්‍ය මූල්‍ය කළමණාකරණ වාර්තාව ඉදිරිපත් කරනු ඇති බව අතිරේක සොලිසිටර් ජනරාල්වරයා සැලකර සිටියේ ය. එහි මූලික පිටපතක් අධිකරණයට බාර කරන ලදි. 2008 ජනවාරි මස 01 වන දින සිට සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාල පරිච්ඡේදයේ දී මහාභාණ්ඩාගාර නිලධාරීන් විසින් 2007 විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ මාරුකිරීම් 108 ක් සිදුකර ඇති බව මෙම පිටපතෙන් අනාවරණය කෙරේ. "ජාතික අයවැය දෙපාර්තමේන්තුව" ශීර්ෂය යටතේ රු. 7,558,078,445/- ක් පුනරාවර්ථන ගිණුමෙන් ද, රු. 13,442,507,041/- ක් ප්‍රාග්ධන ගිණුමෙන් ද මාරු කර ඇත. එනම් මෙම කාල පරිච්ඡේදය ඇතුලත දී රාජ්‍ය නිලධාරීන් විසින් රුපියල් බිලියන 21 කට ආසන්නව, "සංවර්ධන කටයුතු වැඩ සටහනින්" ශීර්ෂයන් බොහෝ ගණනක්ම යටතේ වෙනත් කටයුතු සඳහා මාරු කර ඇත. එයින් ගණනාවක්ම, "සංවර්ධන කටයුතු"***

*වලින් බොහෝ ලෙසින්ම දුරස් වූ විදේශ ගමන්, රථ වාහන මිලදී ගැනීම සහ සෙසු විවිධ අයිතමයන් සඳහා වියදම් වන බව මෙම මාරුකිරීම් අනාවරණය කරති. තවද, විශේෂ අපගමනමය (පිටපැනීම) අවශය කළ කිසිදු හේතුවක් මෙම වාර්තාව නිශ්චිතව නොදක්වයි. එනිසා මෙම අධිකරණයේ නිශ්චය ඉටු කිරීමක් සිදුකර නොමැත." (වැඩිමනත් අවධාරණයෙනි)*

වැඩ සටහන "සංවර්ධන කටයුතු`` යනුවෙන් ශීර්ෂ ගත කර ඇතත්, ඇත්ත වශයෙන්ම විවිධ විය පැහැදම් සඳහා එය භාවිතා කරන බව අතිරේඛ සොලිසිටර් ජනරාල්වරයා පිලිගත්තේය. වත්මන් පනත් කෙටුම්පතේ "ජාතික අයවැය දෙපාර්තමේන්තුව`` යනුවෙන් ශීර්ෂ ගතකොට ඇති 240 වැය ශීර්ෂය යටතේ සංවර්ධන කටයුතු සටහන යටතේ පහත සඳහන් අයුරින් මුදල් වෙන් කොට ඇත. එහි රු.4,980,000,000/-ක් පුනරාවර්ථන වියදම් වශයෙන් සහ රු.7,647,500,000/- ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් ය. ඒ අනුව රුපියල් බිලියන 32 කට ආසන්න මුදලක් වෙනත් අනෙකුත් වැය ශීර්ෂයකට මහා භාන්ඩාගාරයේ නිලධාරීන්ගේ අභිමතය පරිදි, මාරු කිරීමට එසේ වෙන් කොට ඇත. ඉහත සටහන් කර ඇති පරිදි වත්මන් 208 වර්ෂයේ මාස 9 ක් සඳහා රුපියල් බිලියන 21 කට ගණනය වන්නාවූ එවැනි මාරු කිරීම් සිදුකොට ඇත.

2008.11.06 දින පමණක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇති බවට නියත "2009 රාජ්‍ය මූල්‍ය කළමණාකරණය`` යනුවෙයන් ශීර්ෂගත කොට ඇති එම වාර්තාවේම රු.34,422,384,169/-ක පුනරාවර්තන වියදමකටද රු.33,262,585,762/-ක ප්‍රාග්ධන වියදමකටද ගණනය වන්නාවූ එවැනි මාරු කිරීම 127 ක 2007.10.16 සිට 2007.12.31 දක්වා කාලසීමාවේ දී සිදුකොට ඇත. එසේ රුපියල් බිලියන 69 කට ආසන්න මාරු කිරීම් මාස 2 1/2 ඇතුලත සිදු කොට ඇත. එම මාරු කිරීම් සිදුකර ඇත්තේ කුමන විෂයන් සඳහාද සහ මාරු කර ඇත්තේ කොපමණ මුදලක්ද යන්න පරීක්ෂා කර බැලීමේදී අනාවරණය වන්නේ එවකට මහා භාණ්ඩාගාරයේ ලේකම් ඔහුගේම අයවැයක් මෙහෙයවා ක්‍රියා කර ඇති බවයි. (වැඩිමනත් ලෙස අවධාරණය කරමිනි.)

ඉහත ප්‍රකාශ ඇති හේතුන් අනුව පනත් කෙටුම්පතේ 6 (1) වගන්තිය පාර්ලිමෙන්තුව විසින් ක්‍රියාවෙහි යෙදවිය යුතු මහජන මූල්‍යය පාලනය හීන කිරීමකට පත් කර ගන්නක් වන බවත් ඒ අනුව එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 සහ 150 ව්‍යවස්ථාවන්ට අනුකූල වන බව අපගේ මතයයි.

*ඒ අනුව, එසේ මාරු කරන මුදල් නිශ්චිත අමාත්‍යාංශයකට කරනු ලබන පරිපූරක වෙන් කිරීමක් ලෙසට සැලකිය යුතු බවට සහ එවැනි වෙන් කිරීමක් සිදු කිරීමේ දිනයේ සිට දෙමසක් ඇතුලත මාරු කිරීමේ හේතුන් සහ මාරු කිරීම, ඇතුලුව නියත ප්‍රතිපාදනයන් ඇතුලත් කරමින් 6 (1) වගන්තිය සංශෝධනය කලහොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 සහ 150 ව්‍යවස්ථාවන් සමඟ ඇති අනනානුකූලතාවය ඉවත් වන බව ඉහත කී හේතුන් මත අපගේ මතයයි.*

(V) 8 වන වගඋත්තරකරුගේ ඉහත කී කල්ක්‍රියාව සහ ක්‍රියාදාමයන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 ජේදයේ ප්‍රතිඥාවක් යටතේ ඔබඋතුමාණන්ලාගේ අධිකරණයට කර ඇති ප්‍රකාශය **මුසාවක් වන බවට දෙස් දෙති**.

(l) (i) 2003 අංක10 දරණ පණත මගින්, බදු ක්ෂමාවක් වේශයෙන් පනවන ලද "අගතිගාමී`` සියල්ලක්ම වැටලෙන ක්ෂමාව පිළිබඳව 22 වන වගඋත්තරකරු විසින් අභියාචනාධිකරණයේ අංක.CA (Writ) 1661/2003 දරණ ඉල්ලීම ඉදිරිපත් කරන ලදී.

(ii) එම 2003 අංක.10 දරණ පනත නීතියේ ආධිපත්‍යයට එරෙහි වන බවත්, මහජන මුදල් වංචාකරමින් රජයට විස්තීරණ ලෙස පාඩු සිදු කර ඇති බවටත් ඔබඋතුමාණන්ලාගේ අධිකරණය විසින් අංක.SC Reference 1/2004 සහ SC(SD)26/2004 දරණ නඩුවල විනිශ්චය කරමින් ප්‍රකාශ කොට ඇත.

(iii) ආනුශාංගිකව ආදායම් බදු ක්ෂමාවක් පමණක් රඳවා තබමින්, ක්‍රියාත්විතව 2003 අංක.10 දරණ පනත අහෝසි කරමින්, 2004 අංක.10 දරණ පනත 2004 ඔක්තෝබර් මසදී පාර්ලිමේන්තුව විසින් පනවා නීතිගත කරන ලදී.

(iv) එකෙනෙහි, බලපාන නීති බලාත්මක කිරීම සහතික කිරීමට අභියාචනාධිකරණයේ අංක.CA(Writ) අංක.1661/2003 දරණ ඉල්ලීමේ සමථයකට එළඹීමට එවකට ගරු නීතිපති කේ.සී.කමලසබේෂන් ජනාධිපති නීතිඥතුමා එකග වුණු අතර, 2005 ඔක්තෝබර් මස තාක්වූ පෙර මෙම කරුණ විමසීමට නියම කරනු ලැබූ සමථ කොන්දේසි අධිකරණයට ඉදිරිපත් කිරීමට ගරු නීතිපතිතුමා කල් ඉල්ලා සිටිමින් කාරණය සමථය සඳහා නියම කරන ලදී.

(v) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන්, එම Writ ඉල්ලීමේ වගඋත්තරකරුවෙකු වුණ 8 වන වගඋත්තරකරුවා <u>2008.04.18</u> දින 22 විත්තිකරු විසින් මුණ ගැසී, සමථ කොන්දේසිවල කෙටුම්පතක් ඔහුට ඉදිරිපත් කර සිටින ලදුව, ගරු නීතිපතිතුමා සමග <u>වහාම එය සමාප්ථයකට පත් කරන ලෙසට</u> 8 වන වගඋත්තරකරු විසින් කලින් අදායම් බදු කොමසාරිස්වරයා වූ ආදායම් බදු පිළිබඳ මුදල් අමාත්‍යාංශයට උපදේශකයෙකු වුණ ආර්.පී.එල් වීරසිංහට 8 වන වගඋත්තරකරුට නියම කර සිටියේය.

(vi) ඉන් අනතුරුව 22 වන වගඋත්තරකරු විසින් ඔහුද අභියාචනාධිකරණයේ රිට් ඉල්ලීමේ වගඋත්තරකරුවෙකු වුන බැවින් අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම් වෙත යෝජිත සමථය ගැන දන්වමින් 2009.04.19 වන දින දරණ සටහන යවන ලදී.

(vii) එසේ වුවත්, අදායම්බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත පනත් නියමාකාර සහ නිසියාකාර ලෙස බලාත්මක කිරීම සහ රාජ්‍ය අදායම් එකතු කිරීම් නියමාකාරව සහ නිසියාකාරව පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වන මෙම කාරණය නිමාවක් නොවී අභියාචනාධිකරණයේ තවමත් පවතී.

(viii) ඉහත කී සිද්ධීන් 22 වන විත්තිකකරුට 8 වන වගඋත්තරකරු <u>විසින් 2006 අප්‍රේල් මස තාක්වූ ඉහතදී</u> දෙන <u>ලද අවල සහතිකවීම</u> නොතකමින් වන අතර, එවැනි පොදු සහ මහජන වැදගත්කමින් යුක්ත වන්නා වූ විශේෂයෙන් රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳ පරිපාලනය සහ අදාල ව්‍යවස්ථාපිත අණ පනත් බලාත්මක කිරීම හා සබැඳි කාරණයකට අනොන්‍යන්තව 8 වන වගඋත්තරකරුගේ උදාසීනත්වය සහ අදිමදිගතිය එමගින් විදහා දැක්වේ.

(ix) රාජ්‍ය අදායාම් එකතු කිරීම් නියමාකාර සහ නිසියාකාර ලෙස පරිපාලනය කිරීම සහ බලපාන ආදායම් බදු සහ අනිකුත් ව්‍යවස්ථාපිත අණපනත් නියමාකාරයෙන් ඉටු කිරීම සහ බලාත්මක කිරීම සහතික කිරීම සදහා ජාතික සහ මහජන අයිතීන්ගෙන් සහ වැදගත්කමින් යුතු මෙම කාරණය ක්ෂණිකව නිමා කිරීමේ අරමුණින් යුතුව, මෙම කාරණය පිළිබඳව බොහෝ ලිපි ගනුදෙනුවකට අනුගාමීව 22 වන වගඋත්තරකරු විසින් 2009.03.19 දින දරණ ලිපිය වත්මන් ගරු නීතිපතිතුමාට යවන ලදී.

**(X)** 8 වන වගඋත්තරකරුගේ පෙරකී ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරිකම් ඔහු විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ 6 වන ජේදයේ ප්‍රතිඥාවක් යටතේ ඔබඋතුමාණන්ලාගේ අධිකරණයට කර ඇති ප්‍රකාශ **<u>මුසාවක් වන බවට දෙස් දෙති.</u>**

*2006.04.19 දින දරණ සටහනේ සහ ඇමුණුම් සහිතව 2009.03.19 දින දරණ ලිපියේ සත්‍ය පිටපත් "**22RX14**" ලෙස ඒකරාශී ලෙස ලකුණුකොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද මෙයට අමුණා ඇත.*

(m) (i) සී/ස හොටේල් ඩෙවලපර්ස් (HDL) සමාගමේ බංකොලොත් තත්වය කරණකොට ගෙන මූල්‍ය ව්‍යුහයකරණයක් වාහම කලොතින් මිස එය ඇවරකරනවා මිස, HDL සමාගමට වෙනත් විකල්පයක් නොමැති බව, 22 වන වගඋත්තරකරු රජය විසින් නම් කර පත්කල එහි සභාපතිවරයා වශයෙන් 2005.03.31 දින පැවැති එහි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂකවරුන්ට දැනුම් දී සිටියේය.

(ii) හෝටලය ඉදිකර ඇත්තේ රජයේ දේපලක් වන අක්කර 7 ක් පමණ විශාල වැඩිම වාණිජ වටිනාකමකින් යුත් කොළඹ කොටුවේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ඉඩමක බව අවධානයට ගනිමින්, ඔබ උතුමාණන්ලාගේ අධිරකණය විසින් එවැනි ව්‍යුහය කරණයක් ඇති කිරීමට අංක.SC Appeal 99/99 දරණ නඩුවේ ගත් උත්සහය කෙසේ වුවද 2006 ජූලි මස දී ව්‍යර්ථ විය.

(iii) ආනුශාංගිකව, එකී පෙත්සමේ වඩාත් මැනවින් ගෙන හැර දක්වා ඇති පරිදි, මිදිය නොහැකි තරමට වූණ බංකොලොත්භාවය අනුව යුක්ති සහගත සහ සාධාරණීය හේතූන් මත HDL සමාගම ඈවර කිරීම සඳහා 22 වන වගඋත්තරකරු විසින් <u>2006.09.17</u> වන දින කොළඹ දිසා අධිකරණයේ අංක.217/CO දරණ නඩුව පවරන ලදි.

(iv) මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් 2005.07.14 වන දින දරණ ලිපිය මගින් ගරු නීතිපතිතුමාට යවන ලද 8 වන වගඋත්තරකරු දැනුවත්ව සිටි රජයේ යෝජනාවන්ට අනුකූලව 22 වන වගඋත්තරකරු ක්‍රියා කලේ ය.

(v) එසේ නමුත්, 8 වන වගඋත්තරකරු, අධිකරණයෙන් අවසරයක් නොගෙන, HDL සමාගම ඈවර කරනවාට විරෝධය පැමට, 22 වන වගඋත්තරකරුගේ එම ඉල්ලීමට ප්‍රශ්නාත්මක ලෙස උද්දේශිතව මැදිහත් විය.

(vi) ඉඩම රජයට අයිතිව පැවතිමේ සහ HDL සමාගම විසින් රජයට ගෙවීමට පැහැර හැර ඇති ණය මුදල් හෝටලේ ගොඩනැගිලි ආදියේ වටිනාකමට වඩා බොහෝ සෙයින් අභිබවා යෑමේ සම්බන්ධතාවය අනුව, සහ HDL සමාගම යුක්ති සහගත ලෙස සහ දැන් ව්‍යවස්ථාපිත කළයුතු පරිදි ඈවර කිරීමෙන් හෝටලය රජයට 100% ක් අයිති දේපලක් වනු ඇත.

(vii) 2005.06.30 වන දින විට රුපියල් මිලියන 6,351 ක්ව පැවති සහ දැන් රුපියල් මිලියන 9,000/- කට අධික සීමාන්තයක පැවතෙතැයි සැලකෙන උපචිත වූ ප්‍රාග්ධන රුපියල් මිලියන 452.2 ක් පමණක් වන අතර, එයින් ද රුපියල් මිලියන 250.9 ක් නොගෙවා ඇති ලෙසට පැවතෙන එම උපචිත පාඩු HDL සමාගමේ කොටස් ප්‍රාග්ධනය <u>මුළුමනින්ම සොදා පාළුවට පත්කොට ඇත.</u>

(viii) 2008 දෙසැම්බර් මස වන විට HDL සමාගම විසින් රජයට ගෙවීම පැහැර හරින ලද ණය මුදල්, රුපියල් මිලියන 8,718 ක් වූන බවට මුදල් අමාත්‍යාංශය විසින් ස්ථිර කර ඇති අතර, HDL සමාගම විසින් එසේ රජයට ගෙවීම පැහැර හැර තිබූ ණය මුදල් 2005.06.30 වන දිනට රුපියල් මිලියන 4940 ක්, එනම් රුපියල් මිලියන 3,778 ක වැඩි වීමකින් යුතුව පැවති, එම ණය මුදල් අද දින රුපියල් මිලියන 9000 ක් ඉක්මවා යනු ඇත.

(ix) 22 වන වගඋත්තරකරුගේ මුල් පිරිම සහ ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත, හෝටලය පිහිටා ඇති අක්කර 7 කට අධික ඉඩම 1999 ජූලි මස දී රජයට පැවරුන අතර, මහජන දේපල අනිසි ලෙසට පාවිච්චි කිරීමකට තුඩු දෙන අයුරින්, HDL සමාගම විසින් එම ඉඩම භාවිතා කිරීම වෙනුවෙන් කිසිදු මුදලක් ගෙවා නොමැත.

(x) මේ අතරවාරයේ දී 2007.05.03 වන දින ක්‍රියාත්මක වීමට පත්, 2007 අංක.7 දරණ නව සමාගම් පනත, HDL සමාගම, පාත්‍රව ඇති තත්වයන් කරණ කොටගෙන, එය ඈවර කළයුතු වන බවට <u>ව්‍යවස්ථාපිතවම වරම් කොට ඇත.</u>

(xi) ගරු ඔබ උතුමාණන්ලාගේ පහසුව සඳහා 2007 අංක.7 දරණ සමාගම් පනතේ 219 සහ 220 වගන්තීන් මෙහි පහත උපුටා දක්වා අත.

*"219. (1) යම් සමාගමක් විසින් ගෙවිය යුතු ණය, එසේ ගෙවිය යුතු වනවිට ගෙවීමට සමාගමට හැකියාවක් නොමැති යැයි විශ්වාස කරන ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම සඳහා ඈවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කළ යුතු ද නැතහොත් සමාගමේ ව්‍යාපාර කටයුතු තවදුරටත් කර ගෙන යා යුතු ද යන්න සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් නොපමාව කැඳවිය යුතු ය.*

*(2) (1) වන උපවගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂකවරයකු, ඒ උපවගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ක්‍රියා කිරීම පැහැර හැරියා වූ ද ඒ පැහැර හැරීම කරන ලද අවස්ථාවේ දී සමාගම විසින් ගෙවිය යුතු ණය එසේ ගෙවිය යුතු වන විට ගෙවීමට සමාගමට හැකියාවක් නොමැති වූ ද, ඉන් අනතුරුව සමාගම ඈවර කිරීමට පාත්‍ර කොට ඇත්තා වූ ද අවස්ථාවක, සමාගම එහි ව්‍යාපාර කටයුතු දිගටම කරගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ ණය හිමියන්ට ඇරීමට සිදුවූ යම් පාඩුවක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට ඒ අධ්‍යක්ෂවරයා යටත් වන බවට ආඥාවක්, ඈවරකරුගේ හෝ සමාගමේ ණය හිමියකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.*

*(3) පහත සඳහන් අවස්ථාවකදී, එනම්,*

*(අ) ඈවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කිරීමට, (1) වන උප වගන්තිය යටතේ කැඳවන ලද රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම ඈවර කිරීමට අධිකරණයට ඉදිරිපත් නොකිරීමට යෝජනා සම්මත කර ගනු නොලැබුව හොත්;*

(ආ) සමාගම විසින් ගෙවිය යුතු ණය, එසේ ගෙවිය යුතු වන විට ගෙවීමට සමාගමට හැකියාවක් නොමැති යයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු කිසිවක් එකී රැස්වීම පවත්වන ලද අවස්ථාවේ දී නොතිබුණ නම්; සහ

(ඇ) ඉන් අනතුරුව සමාගම ඈවර කිරීමට පාත්‍ර කරන ලද නම්, සමාගම විසින් එහි ව්‍යාපාර කටයුතු දිගටම කරගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ ණය හිමියන්ට දැරීමට සිදුවූ යම් පාඩුවක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට, යට කී රැස්වීමට පැමිණ ඈවරකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කිරීමට පක්ෂව ඡන්දය දෙන ලද අධ්‍යක්ෂකවරයන් නොවන අධ්‍යක්ෂකවරයන් යටත් වන බවට ආඥාවක්, ඈවරකරුගේ හෝ සමාගමේ ණය හිමියකුගේ හෝ ඉල්ලීම මත අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

"220 (1) යම් සමාගමක ශුද්ධ වත්කම් ඒ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව යම් අවස්ථාවක දී ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකුට පෙනී යන්නේ නම්, ඒ බව ඒ අධ්‍යක්ෂකවරයාට දැන ගැනීමට ලැබීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත දී, මේ වගන්තියේ කාර්යය සඳහා ඒ සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම, එසේ කැඳවනු ලැබූ දින සිට වැඩ කරන දින හතළිහක් පසුවීමට පෙර පවත්වනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ රැස්වීමක් කැඳවන දැන්වීමක් සමග, -

(අ) සමාගමට දැරීමට සිදු වී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය ;

(ආ) සමාගමට දැරීමට සිදු වී ඇති පාඩුවලට හේතුව හෝ හේතු ;

(ඇ) එවැනි පාඩු තවදුරටත් සිදු වීම වැළැක්වීම සඳහා හෝ දැරීමට සිදු වූ පාඩු පිරිමසා ගැනීම සඳහා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර කිසිවක් ගෙන ඇති නම් ඒ පියවර

පිළිබඳව කොටස් හිමියන්ට දැනුම් දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද වාර්තාවක් යවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කැඳවන ලද රැස්වීමක දී සාකච්ඡා කළ යුතු කටයුතු, අධ්‍යක්ෂවරයන් විසින් පිළියෙල කරන ලද වාර්තාව සහ සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විය යුතු ය. ඒ වාර්තාවට සහ සාමාන්‍යයෙන් සමාගමේ කළමනාරණයට අදාළ ප්‍රශ්න ඇසීමට සහ ඒ පිළිබඳව සාකච්ඡා කොට එහි ලා තම අදහස් දැක්වීමට යුක්තිසහගත අවස්ථාවක් කොටස් හිමියන්ට ලබා දීමට ඒ රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා වගබලා ගත යුතු ය.

(4) යම් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, දැනදැනම හා ඕනෑකමින් ම ඒ පැහැර හැරීමට බලය දෙන හෝ ඒ පැහැර හැරීම දිගටම කර ගෙන යාමට ඉඩ දෙන සෑම අධ්‍යක්ෂවරයකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය."

(xii) දැනුම් දීමකට ලක් කර තිබියදීත්, ඉන් අනතුරුව ද ව්‍යවස්ථාපිතයේ ඉහත කී වගන්තින් උල්ලංඝනය කරමින් HDL සමාගම ඇවර නොකිරීම මගින්, 2007 අංක.7 දරණ සමාගම් පනතේ ඉහත සඳහන් විධිවිධානයන්ගේ නියමයන් අනුව, HDL සමාගම විසින් ගෙවීම පැහැර හරින ලද්දා වූ ණය මුදල් සඳහා අධ්‍යක්ෂවරුන් පුද්ගලිකවම වගකිව යුතු වන්නෝ ය.

(xiii) 2007 අංක.7 දරණ සමාගම් පනතේ 529 වගන්තියේ අධ්‍යක්ෂවරුන් කවුරුන්දැයි යන්නට දී ඇති අර්ථ නිරූපණය අනුව 2007 අංක.7 දරණ සමාගම් පනතේ යම් විධාන සම්බන්ධයෙන් HDL අධ්‍යක්ෂකවරුන්ට මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් 8 වන වගඋත්තරකරු, ඇතුළත් වේ. ඒ මෙසේ ය.

*"අධ්‍යක්ෂ" යන්නට :*

*(අ) කවර නමකින් හැඳින්වුව ද සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වය උසුලන තැනැත්තෙක් ද;*

*(ආ) 187, 188, 189, 190, 197, 374 සහ 377 වන වගන්තිවල කාර්යය සඳහා,*

*(i) (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු ක්‍රියාකළයුතු වන්නේ හෝ ක්‍රියා කිරීමට පුරුදු වී ඇත්තේ යම් තැනැත්තකුගේ විධාන හෝ උපදෙස්වලට අනුකූලව ද ඒ දෙවනු කී තැනැත්තෙක් ;*

*(ii) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කළයුතු වන්නේ හෝ ක්‍රියා කිරීමට පුරුදු වී ඇත්තේ යම් තැනැත්තකුගේ විධාන හෝ උපදෙස්වලට අනුකූලව ද ඒ තැනැත්තා;*

*(iii) සමාගමේ ව්‍යවස්ථාවලියෙන් බාහිරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදීමට නියමිතව තිබිය හැකි බලතල ක්‍රියාවේ යොදන හෝ ක්‍රියාවේ යෙදීමට හිමිකම තිබෙන තැනහොත් ඒ බලතල ක්‍රියාවේ යෙදීම පාලනය කරන හෝ පාලනය කිරීමට හිමිකම ඇති තැනැත්තෙක් ; සහ*

*(ඇ) 187 සිට 195 දක්වා (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල සහ 197, 374 සහ 377 වන වගන්තිවල කාර්ය සඳහා, මණ්ඩලයේ බලතල හෝ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් යම් තැනැත්තකුගේ කැමැත්ත හෝ එකඟත්වය සහිතව සෘජුවම පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට ද නැතහොත් ඒ බලතල හෝ කාර්ය කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත හෝ එකඟත්වය ඇතිව ක්‍රියාවේ යොදනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ යම් තැනැත්තකේ , ඇතුළත් වේ;*

පුද්ගලයකු වෘත්තිමය තත්වයකින් පමණක් ක්‍රියා කරනතාක් ප්‍රමාණයට (ආ) සහ (ඇ) ඡේදයන් හි විධිවිධානයන් පුද්ගලයකුට බලපාන්නේ නැත.

(xiv) උල්ලංඝනය කළ නොහැකි, ආඥාකළ **"අධ්‍යක්ෂකවරුන්ගේ කාර්ය භාරයන්"** 2007 අංක.7 දරණ සමාගම් පනතේ 187 සහ 190 වගන්තිවල ව්‍යවස්ථාපිතව නියම කර ඇත.

(xv) රජයට බහුතරයක් අයත් සහ රජයේ පාලනයට යටත් සමාගමක් වීමෙන්, HDL සමාගමට ව්‍යවස්ථාපිත නීතිය නින්දිත සහ ප්‍රකට ලෙස උල්ලංඝනය කළ නොහැකි අතර ඊට පටහැනි ලෙසින් මොනයම් ආකාරයකින්වත් ව්‍යාතිරේඛකයින් තොරව, එවැනි සමාගමක් ව්‍යවස්ථාපිත නීතියට දැඩි අනුකූලතාවයින් යුතුව ක්‍රියාකළ යුතුය.

(xvi) 22 වන වගඋත්තරකරුගේ ක්‍රියාකාරකම් හේතුකොටගෙන, ජපන් කොන්ත්‍රාත්කරුවන් විසින් රජය විසින් නිකුත් කර තිබුන ඇපකර මත රජයෙන් ඉල්ලා තිබුන ඔවුන්ගේ ඉල්ලීම්වලින් ජපන් යෙන් මිලියන 17,586 ක් (එවකට එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට සහ ශ්‍රී ලංකා රුපියල් 10,200 කට සමාන මුදලක්) ඔවුන් විසින් 1995 ජූනි හිදි කපාහැර, (මුලින් 1999 වන විට මුළුමනින්ම ගෙවිය යුතුව තිබුන) ඉතිරිය, 2010 වසර තෙක් වසර 15 ක කාලසීමාවක් පුරා (කලින් වර්ෂයකට 6% බැගින් වූන) අඩුකළ වසරකට 5.25% බැගින් වූ පොලියක් සහිතව ගෙවීමට ප්‍රතිලේඛණගත කරන ලදි.

(xvii) ජාතික හා මහජන අයිතීන් තකා 22 වන වගඋත්තරකරු ක්‍රියා කරන ලදුව, මහාභාණ්ඩගාරයේ ලේකම්වරයා වශයෙන්, 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම්, ඔහු විසින් ප්‍රතිඥාවක් මත ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට, ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 ඡේදයේ කර ඇති ප්‍රකාශය **මුසාවක් වන බවට දෙස් දෙන** අතර වැඩිදුරටත් **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇත්තා වූ අතිකුත් හෝටල්කරුවන්ගේ සමානාත්මභාවය උල්ලංඝනය කරනු ලැබේ.**

> ***2006.11.17** දින දරණ ඇවරකිරීමේ පෙත්සමේ, **2005.07.14** දින දරණ ලිපිය මගින් ගරු නීතිපතිතුමා වෙත මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් යවන ලද රජයේ යෝජනාවලිය ශ්‍රේෂ්ඨාධිකරණයේ **2006** ජූලි මසදී නීතිකෘතින් හි සහ මුදල් අමාත්‍යාංශය විසින් ස්ථිර කර ඇති පරිදි රජයට ගෙවීම HDL සමාගම විසින් පැහැර හරින ලද ණය මුදල් විස්තරවල සත්‍ය පිටපත් ඒකරාශීව **"22RX15"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙසට අයැද මෙයට යාකොට ඇත.*

ඔබ උතුමණන්ලාගේ අධිකරණයට අවශ්‍ය යයි හැගී ගියහොත්, මෙම කාරණය පිළිබද සිද්ධිමය කාරණා ගැන අනුදැනුමක් ලබා ගනු පිණිස තවමත් නිමා නොවී පවතින අංක 217/CO දරණ නඩුවේ නඩු වාර්තාව කොළඹ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකිය.

(n) (i) 8 වන වගඋත්තරකරු විසින් මෙහෙයවා ඇති පුද්ගලිකකරණයන් අතුරින් ප්‍රශ්ණාත්මක ලෙස තෝරාගත් පාර්ශවයකට එයද ප්‍රශ්නයට තුඩු දී තිබුන, මිළ ගණකට සහ ක්‍රියාවලියක් අනුගමනය කරමින් සිදුකළ සී/ස සෙවනගල සීනි කර්මාන්ත සමාගම පුද්ගලිකකරණය එකක් වේ.

(ii) සේවක කොටස්, ඉඩම් බද්ද පිළිබඳ ප්‍රශ්ණ සහ අනියම් සේවකයින් විසින් වන්දි ඉල්ලා සිටීම සම්බන්ධයෙන් පශ්චාත් ප්‍රශ්ණ ගණනාවක් මතුවීම එම පුද්ගලිකකරණයේ ප්‍රතිඵලයක් විය.

(iii) 2004 ඔක්තෝබර් හිදි හෝ එයට ආසන්නයේදී පුද්ගලිකකරණයට අනතුරුව, සුදු සීනි සහ රතු සීනි සඳහා ICUMSA ප්‍රමතියන් යෝජනා කරමින් සී/ස කලා ට්‍රේඩර්ස් (පුද්ගලික) යන සමාගමක් විසින් කරන ලද සීනි නැව්ගත කිරීමක් සම්බන්ධයෙන් සී/ස සෙවනගල සීනි කර්මාන්ත සමාගම විසින් නියෝජනයක් කර ඇත.

(iv) රේගු අධ්‍යක්ෂක ජනරාල්වරයාට 8 වන වගඋත්තරකරු විසින් මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් අමතන ලද 2004.10.04 දින දරණ ලිපිය මගින් සුදු සීනි සම්බන්ධයෙන් පැහැදිලි අර්ථ දැක්වීමක් කර නොමැති බවට ඔහුට දැනුම් දීමක් කර ඇති බව දන්වා යවා ඇත.

(v) වෙසෙසින්ම සී/ස සෙවනගල සීනි කර්මාන්ත සමාගම විසින් කරන ලද නියෝජනයන්ට සර්ව සමලෙසින්ම ICUMSA ප්‍රමතියේ සුදු සීනි සඳහා තීරු බදු පනවමින් කරන ලද කැබිනට් මණ්ඩලයේ තීරණය, 8 වන වගඋත්තරකරු විසින් වෙසෙසින්ම 2004.10.04 දිනයම දරණ ලිපියකින් දන්වා යවා ඇත.

(vi) ප්‍රශ්නාත්මක ලෙසින්, රේගු අධ්‍යක්ෂක ජනරාල්වරයාට, ඉහත කී <u>2004.10.04</u> දින දරණ දෙවැනි ලිපිය <u>2004.11.23</u> ෆැක්ස් කර ඇති බවට සාක්ෂි දරණ අතර, 2004.10.04 දින දරණ කලින් ලිපිය <u>2004.10.04</u> දින ෆැක්ස් කර ඇත.

(vii) <u>ප්‍රශ්ණාත්මක ලෙසම 2004.10.04 දින දරණ එක ලිපියකවත් අතින් ලිපියට සඳහනක් කර නැත.</u>

(viii) ඉහත කී කාරණයන් හේතුකොට ගෙන සිදුව ඇති ප්‍රතිඵලය වී ඇත්තේ සී/ස කලා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගමේ සීනි තොගය රේගුව විසින් අත්අඩංගුවට ගැනීම සහ තවමත් සොයාගත නොහැකි බවට වාර්තාවී ඇති සී/ස කලා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂකවරයා පැහැර ගෙන යෑම සහිතව රේගු පරක්ෂණයක් උද්ගත කිරීමය.

(ix) කලින්, ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් SC.SPL.LA අංක.138/2005 දරණ නඩුවේ රේගු නිලධාරීන්ට අවවාද කරමින්, රේගු පරීක්ෂණය අවසන් වනතෙක්, විකුණුම් උත්පාදන මුදල් තැන්පත් කිරීමෙන්, සීනි තොගය සී/ස කලා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගමට මුදාදහරින ලෙසට නියම කරන ලදී.

(x) සුදු සීනි සහ රතු සීනි වල විශේෂණය අර්ථ දැක්වීම කිරීමේ ව්‍යවස්ථාපිත බලධාරියා වන්නේ එවැනි විශේෂනය අර්ථ දැක්වීම සඳහා ස්ථාපිත ක්‍රියා පිළිවෙතක් ඇති ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මිස, ඇත්ත වශයෙන්ම ව්‍යවස්ථාපිත බලධාරීන්ගේ බලය පැහැර ගැනීමට නොහැකි 8 වන වගඋත්තරකරු නොවන්නේය.

(xi) මෙම LMSL නඩුවේ පවා, මහා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් 8 වන වගඋත්තරකරු මැදිහත් වී PERC ආයතනයේ සභාපති වශයෙන් 22 වගඋත්තරකරුට අ.8 රු.2 පර්.21.44 ක් විශාල බිලුමැන්ඩල් ඉඩම සහ ගබඩා ටැංකි පරීක්ෂාවකින් තොරව හදිසියේ පවරන ලෙසට පෙරැත්ත කර සිටියේ නමුත් COPE වෙත යවන ලද 22 වන වගඋත්තරකරුගේ 2006.12.01 දින දරණ ලිපියෙන් සාක්ෂි දරණ ප්‍රකාර 22 වන වගඋත්තරකරු ඊට අවනතවීම ප්‍රතික්ෂේප කර සිටියේ ය.

(xii) PERC සභාපතිවරයා/මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන්, 8 වන වගඋත්තරකරුගේ ඉහත කී කල්ක්‍රියාව සහ ක්‍රියාදාමයන් ඔහු විසින් ප්‍රතිඥාවක් මත ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 ඡේදයේ ඇති ප්‍රකාශ කර ඇති දෑ **<u>මුසාවක් වන බවට දෙස් දෙයි.</u>**

PERC වාර්ෂික වාර්තාවේ 5 පිටුවේ, 2004.10.06 දින දරණ සී/ස සෙවනගල සීනි කර්මාන්ත සමාගමේ ලිපියේ, 2004.10.04 දින දරණ 8 වන වගඋත්තරකරුගේ ලිපි දෙකේ, සුදු සීනි සහ රතු සීනි සඳහා ලංකා ප්‍රමිති ආයතනයේ විශේෂනයන් හි සහ 22 වන වගඋත්තරකරුගේ 2006.12.01 දින දරණ ලිපියේ සත්‍ය පිටපත් "22RX16" ලෙස ඒකරාශීව ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙසට අයැද අමුණා ඇත.

(o) (i) ශ්‍රී ලංකා මහා බැංකුවේ ස්ථාවර තනතුරට ආපසු පත් වී යන ලෙසට PERC හි නීති අධ්‍යක්ෂ වෙත උපදෙසක් 2004 ජනවාරියේ දී එවකට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් දී ඇත.

(ii) 2004 අප්‍රේල් මසදී රජය වෙනස් වීමෙන් පසුව PERC හි නීති අධ්‍යක්ෂක විසින් මූලික අයිතිවාසිකම් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

(iii) අනුෂංගිකව PERC වෙතින් රු.750,000/- ක වන්දි වශයෙන් PERC නීති අධ්‍යක්ෂක ඉල්ලා ඇති අතර, එම ඉල්ලීම සහ එවැනි වන්දි ගෙවීමක් ආගණනය කිරීමක් පැන නොනගින බවද දන්වමින් එම ඉල්ලීම මත විය යුතු වන බවට තර්කාන්විත පදනමක් 2004.11.01 දින දරණ ලිපිය මගින් ගරු නීතිපතිතුමා මතයක් දරා ඇත.

(iv) 2004/05 හිදි 22 වන වගඋත්තරකරු PERC සභාපතිවරයා ලෙස සිටියදී, මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් PERC හි සාමාජිකයකුව සිටි 8 වන වගඋත්තරකරු ගරු නීතිපතිතුමා විවේචනයට ලක් කරමින් කිසිදු ප්‍රශ්ණයකින් තොරව එම ඉල්ලීම PERC විසින් ගෙවිය යුතු බවට බල කර සිටියේය.

(v) PERC රැස්වීමකදී එම ඉල්ලීම ගෙවීමට බලකර සිටිමින්, 8 වන වගඋත්තරකරු විසින් ප්‍රදර්ශනය කළ එදිරිවාදී උද්දච්චභාවය නොතකමින්, එවැනි ගෙවීමක් කිරීමට අවනතනොවී 22 වන වගඋත්තරකරු සහ PERC ආයතනය විසින් එය ප්‍රතික්ෂේප කර සිටින ලදී.

(vi) එවැනි වන්දි ඉල්ලීමක් ගෙවීමේ සහනයක් ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් ප්‍රදානය කළේ නැති අතර, 2005 ජූලි මසදී එම මූලික අයිතිවාසිකම් ඉල්ලීම නිමා විය.

(vii) අදාළ සිද්ධිමය කාරණා ගෙනහැර දක්වමින් 8 වන වගඋත්තකරුගේ ආකල්පය සහ හැසිරීම, කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් වන රජයේ සේවකයන් විසින් ඔවුන්ගේ මතයන් නිදහසේ ප්‍රකාශ කිරීමේ නිදහසට බාධකයක් වන බව පෙන්වා දෙමින්, වෙනත් දේ අතර, පහත සඳහන් අයුරින් PERC සභාපතිවරයා වශයෙන් කියාපාමින්, 22 වන වගඋත්තරකරු එවකට ඇයගේ විෂය පථය යටතේ PERC ආයතනය පැවති එවකට අතිගරු ජනාධිපතිතුමියට 2005.03.24 දින දරණ රහසිගත සංදේශය යවා සිටියේය.

> *"ඉදිරිපත් කර ඇති ඉහත කී සමථය මෝසම කොමිෂන් සභාවේ තීරණයට අනුකූල නොවන බවට චෝදනා නගමින්, ගරු නීතිපතිතුමාට සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අපහාසාත්මක ප්‍රකාශ කරමින්, එකෙනෙහි ක්ෂණිකවම, 2004.11.22 වන සඳු දින මහා භාණ්ඩාගාරයේ ලේකම් මට දුරකථනයෙන් අමතා එදිරිවාදී උද්ධච්ඡ ලීලාවෙන් කථා කළේය."*

> *"මහාභාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් ඔහු දරණ තානාන්තරය හේතුකොටගෙන, ඔහුගේ ආකල්පය සහ හැසිරීම, රාජ්‍ය සේවකයන් වන කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් විසින් නිදහසේ ඔවුන්ගේ මතයන් නිදහසේ ප්‍රකාශ කර සිටීමේ නිදහසට බාධකයක් වේ."*

(viii) හාත්පසින්ම "SC (FR) අංක.158/2007 දරණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා නඩුවේ එළිදරව්වීම් අභිමුඛයේ ප්‍රශ්නාත්මක ලෙස 8 වන වගඋත්තරකරු විසින් වසා ඇමීම සිදුකළ රාජ්‍ය ව්‍යාවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට නැවත අනුයුක්තවීමට, රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සිට ඉන් ඉල්ලා අස්වූ හාර්වර්ඩ් සරසවියෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිලාභී සහ එක්සත් රාජධානියේ කළමණාකාර ගණකාධිකරුවන්ගේ සම්මානනීය සාමාජිකයකු වන ඊ.අරුමුගම් නැවත රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවට අනුයුක්තවීම සහ රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය නොතකමින් අතිරේක අධ්‍යක්ෂකවරයෙකු ලෙස ඔහු රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවට නැවත අනුයුක්ත වීම ද 8 වන වගඋත්තරකරු, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ලෙස, ඊට හාත්පසින්ම වෙනස් අයුරින් වලක්වා සිටින ලදි. <u>එම මූලධර්මයට 8 වන වගඋත්තරකරුට ද බලාත්මක විය යුතුය.</u>"

එසේ කරන ලද්දේ, 22 වන වගඋත්තරකරු සහ ගරු නීතිපතිතුමා ප්‍රතිවිරෝධී වූ, ඩිස්ටිලරිස් සන්ධානය විසින් රජයෙන් රුපියල් මිලියන 2059 ක ඉල්ලීමක් කර සිටීමේ ප්‍රතිඵලයක් ගෙන දුන්, රුපියල් මිලියන 3000 කින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ගිණුම් හොර රහස් ලෙස සහ අතීතයට බලපාන අන්දමින් ඩිස්ටලරිස් සන්ධානය සහ අර්නස්ට් සහ යං සමාගම විසින් ගලපා තිබීම සොයා ගැනීම සඳහා ඒ.ආරුමුගම් විසින් 22වන වගඋත්තරකරුට සහාය වුන නිසා බව 22 වන වගඋත්තරකරු තරයේ විශ්වාස කරයි.

(ix) සාවද්‍ය, නීතිවිරෝධී සහ අනෛතික ලෙසට ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අහෝසි කරන ලද LMSL සමාගම පුද්ගලීකරණය සම්බන්ධයෙන් වුන ගිවිසුම් හොර රහසිගතව ලියා අත්සන් කිරීමෙහිලා PERC හි එකී නීති අධ්‍යක්ෂ උපකාරකම් ඇති බව සහ වගකිව යුතු බව අංක.SC(FR)158/2007 iy SC(FR)2009/2007 දරණ නඩුවල ඔබ උතුමාණන්ලාගේ අධිකරණය ඉදිරියෙහි දැන් අනාවරණය වී ඇත.

(x) 8 වන වගඋත්තරකරු මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 6 ජේදයේ ප්‍රතිඥාවක් යටතේ ප්‍රකාශ කර ඇති දෑ, 8 වන වගඋත්තරකරුගේ ඉහත කී ක්‍රියා චරියාවෙන් සහ ක්‍රියාදාමයන්ගෙන් **මුසාවක් වන බවට දෙස් දෙයි**.

*2004.01.08 සහ 2004.11.01 දිනයන් දරණ ලිපිවල සහ 2005.03.24 දින දරණ 22 වන වගඋත්තරකරුගේ සංදේශයේ සත්‍ය පිටපත් ඒකරාශි ලෙස **"22RX17"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද අමුණා ඇත.*

**15.** පූර්වෝක්ත කාරණයන්ගේ සම්බන්ධතාවය කරණකොට ගෙන 22 වන වගඋත්තරකරු මෙසේ ප්‍රකාශ කර සිටී.

(අ) ඔහුගේ පෙත්සමට "A" ලෙස ලකුණු කොට ඇති, ජනාධිපතිතුමාට පිටපතක් සහිතව ඔහු විසින් යවා ඇති 2008.07.25 දින දරණ ලිපියෙන් පහත දැක්වෙන උපුටා දැක්ම අඩංගු වන 8 වන වගඋත්තරකරුගේ පෙත්සමේ 5 ජේදයේ, වඩාත් විශේෂයෙන් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අනුරූප 6 ජේදයේ අඩංගු, ඔහු විසින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට නිහීත ගරුත්වයක් දක්වමින්, නිර්භීත සහ බිය සැකයකින් තොරව කර ඇති ප්‍රකාශය, **මුසාවක් වන බවට දෙස් දෙන**, ඉහත දැක්වෙන කාරණයන් පිළිබඳව ජාතික හා මහජන අයිතීන් අරභයා කිසිවකු නීතියේ ආධිපත්‍ය අභිබවා නොයැම කරණකොට, ගෙන ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කාරුණිකව අධිකරණමය අවධානයකට කාරුණිකව ගත යුතු ය.

*"රාජ්‍ය සේවයේ මාගේ (කලින් 8 වන වගඋත්තරකරුගේ) මුළු සේවා කාලය පුරාම, මම සත්‍යවාදිකම සහ අවංකභාවය උපරිම මට්ටමින් පවත්වාගෙන ගියෙමි ......................... රාජකාරී කටයුතු උපරිම කැපවීමකින් සහ අවංක සිතින් යුතුව රටෙහි විශිෂ්ටතම යහපත වෙනුවෙන් ඉටුකල අතර, ජනතා අයිතීන් කවරවිටකවත් මොනයම් හේතු තත්වයක් මතවත් අන්තරායකට හෙළුවේ නැත ........"*

(ආ) ඉහත අනාවරණය වී ඇති පරිදි, 8 වන වගඋත්තරකරු, සියල්ලටම වඩා රජයේ ප්‍රධාන ගණකාධිකරණ නිලධාරිවරයා වශයෙන්, බොහෝ අවස්ථාවන්හි දි අයෝග්‍ය සහ නොහොබිනා අයුරින් සහ සමහර අවස්ථාවන්හි දි ව්‍යවස්ථාපිත අණ ද උල්ලංඝනය කරමින් ක්‍රියා කොට ඇත.

(ඇ) ඔබ උතුමාණන්ලාගේ අධිකරණය නොමග යැවීමේ නියාවෙන්, වැදගත් සිද්ධිමය කාරණාවන් යටපත් කරමින්, වැරදි කරුණු කියාපෑම් සහ අසත්‍ය ප්‍රකාශ සහිතව, 8 වන වගඋත්තරකරු විසින් මෙම ඉල්ලීම කර ඇත.

16. ඉහත දැක්වෙන අන්දමට වූන 8 වන වගඋත්තරකරුගේ ක්‍රියා චරියාව සහ ක්‍රියාදාමයන් සහ ඉහත ගෙනහැර දක්වා ඇති සිද්ධිමය කාරණා සහ හේතු තත්වයන්;

(අ) ඔබ උතුමාණන්ලගේ අධිකරණයෙන් ඔහු දැන් පතා සිටීමට වැයම් කරන සහනයන් ඉල්ලා සිටීමට 8 වන වගඋත්තරකරු නුසුදුස්සකු වී ඇති බවටත්,

(ආ) ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කරන ලද නියෝගයට අනුගාමීව ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ඉදිරිපත් කරන ලද ඔහුගේ 2008.10.16 දින දරණ ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අඩංගු පොරොන්දුවෙන් ඔහු මුදා හැරීම ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කාරුණිකව ප්‍රතික්ෂේප කිරීමට තුඩුදීමටත්,

(ඇ) 2008.07.21 දින නඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් ඊට අනුගාමීව එවැනි බලධාරීන්ට ක්‍රියා කිරීමට ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් අණ කරන ලදුව, අදාළ නීතින් බලාත්මක කිරීමේ බලධාරීන් විසින් ක්‍රියා කටයුතු ඉදිරියට කරගෙන යනු ලබන බව නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට ස්ථිර කර සිටීමේ සම්බන්ධතාවය කරණ කොටගෙන, ඉහත දක්වා ඇති අදාළ කාරණයන් මත ක්‍රියා කටයුතු කරන ලෙසට අදාළ නීති බලාත්මක කරණ බලධාරීන්ට ඔබ උතුමාණන්ලාගේ අධිකරණය විසින් කාරුණිකව අණ කිරීමට තුඩු දීමටත්,

හොඳාකාර සහ වලංගු වන්නාවූ සහ සෑහෙන ප්‍රමාණයටත් වඩා හේතුන් ස්ථාපනය කරන බව 22 වන වගඋත්තරකරු ඉතා ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කර සිටී.

17. (අ) ලේඛණ පරිමානිකව විශාල වන බැවින්, සමහර අවස්ථාවල ඇමුණුම් රහිතව වාර්තාවල අදාල කොටස් සහ සමහර ලේඛණ පමණක් ලකුණු කර ඇත.

(ආ) ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට අවශ්‍ය වෙතොත් අදාල වන පරිදි, එම වාර්තාවන් සහ ඇමුණුම් ඉදිරිපත් කිරීමට 22 වන වගඋත්තරකරු පොරොන්දු වී සිටී.

18. ඉහත සම්ප්‍රකාශයන් තහවුරු කරමින් 22 වන වගඋත්තරකරුගේ දිවුරුම් ප්‍රකාශය අමුණා ඇත.

එබැවින් 22 වන වගඋත්තරකරු ගෞරවපූර්වකව ඔබ උතුමාණන්ලාගේ අධිකරණයෙන් අයැද සිටිනු ලබන්නේ,

(අ) 8 වන වගඋත්තරකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප සහ/හෝ නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) ගාස්තු ප්‍රදානය කරන ලෙසත්

(ඇ) ගරු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට සැහෙනැයි හැඟී යන වෙනත් එවැනි සහ වැඩිදුර සහනයන් සදහාත්ය.

අත්සන් කලේ: - නිහාල් ශ්‍රී අමරසේකර

22 වන වගඋත්තරකරු

2009/12/08

K. R. PREMATILAKE
JUSTICE OF THE PEACE (ALL ISLAND)
REG. NO. 99/08/WP/AI/B/011
SWORN TRANSLATOR
21 A, MEERANIYA STREET,
COLOMBO 12.
TEL: 2345973